# සිංහල

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 12 වන ශ්‍රේණිය

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# සිංහල

## 12 වන ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## (2009 වසරේ සිට ක්‍රියාත්මක වේ)

සිංහල දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනය
පළමුවන මුද්‍රණය 2009

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපනය ආයතනය

මුද්‍රණය :
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

## පෙරවදන

වර්ෂ 2007 දී 6 සහ 10 ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස (උ.පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එම නිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේ දී ගුරුවරුන්ට මහත් සේ ප්‍රයෝජනවත් වනු ඇත.

අ.පො.ස. (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතියික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10,11 ශ්‍රේණි) විෂය මාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10, හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළ යුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස. (උ.පෙළ) විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්තාව සලසා තිබේ.මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂයට ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීමය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතුය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණසා පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්

## සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල ඔබට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිත ව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්ති කාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශය මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ද ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශය සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මගපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට ද මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වෙමි.

විමල් සියඹලාගොඩ
සහාකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| උපදේශනය | - | මහාචාර්ය ලාල් පෙරේරා මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| අධීක්ෂණය | - | විමල් සියඹලාගොඩ මහතා<br>සහාකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය විශේෂඥ උපදෙස් | - | මහාචාර්ය රත්න විජේතුංග මහතා |
| සම්බන්ධීකරණය | - | ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>ව්‍යාපෘති නිලධාරී |
| විෂය මාලා කමිටුව | - | මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා<br>මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා<br>මහාචාර්ය රත්න විජේතුංග මහතා<br>මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස මහතා<br>මහාචාර්ය විමල් ජී බලගල්ල මහතා<br>මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා<br>මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා<br>මහාචාර්ය ගාමිණී දැළ බණ්ඩාර මහතා<br>මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතා<br>මහාචාර්ය රෝහිණී පරණවිතාන මහතා<br>ආචාර්ය නන්දසේන ගමාච්චි මහතා<br>විමල් සියඹලාගොඩ මහතා<br>එස්.ඕ. ප්‍රනාන්දු මහතා<br>රෝහණ දන්දෙනිය මහතා<br>පියසීලී ජයවර්ධන මහත්මිය<br>එස්. දිසානායක මහත්මිය<br>පේමසිරි සුබසිංහ මහතා<br>එච්.පී. සුසිල් සිරිසේන මහතා<br>ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මහතා<br>විමලා රණසිංහ මහත්මිය<br>නයන තිලක් රත්නායක මහතා<br>ජේ. සෙනෙවිරත්න මහතා<br>යූ.ජේ.ජී. මාග්‍රට් මහත්මිය<br>එන්.එම්. විමලසේන මහතා<br>සුජාතා ඔබේසේකර මහත්මිය |

| | | |
|---|---|---|
| ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර) | - | එස්.ඒ. ප්‍රේමසිරි සුබසිංහ මහතා<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි |
| | - | ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>ව්‍යාපෘති නිලධාරි |
| | - | කුකුරම්පොළ ඤාණවිමල හිමි<br>ව්‍යාපෘති නිලධාරි |
| | - | ඩබ්ලිව්.පී. මංගල ගුණරත්න මහතා<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| | - | එම්.ජී. මුණසිංහ මහතා<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| | - | පී.ටී.එම්. රත්නායක මිය<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| | - | පී.ඒ.ඩී. රුවනි සිසිජා කල්දේරා මෙය<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| ලේඛක මණ්ඩලය (බාහිර) | - | එච්.පී. සුසිල් සිරිසේන මහතා<br>කථිකාචාර්ය |
| | - | ජේ. සෙනෙවිරත්න මහතා<br>විදුහල්පති (විශ්‍රාමික) |
| | - | ජී.එම්. ප්‍රේමරත්න මහතා<br>නියෝජ්‍ය විදුහල්පති (විශ්‍රාමික) |
| | - | ආර්.පී. ධර්මපාල මහතා<br>ගුරු සේවය |
| | - | ඩබ්ලිව්.එම්.එන්. බණ්ඩාර මහතා<br>ගුරු සේවය |
| | - | ඩබ්ලිව්.ආර්.ඒ.එස්.එල්. රණසිංහ මහත්මිය<br>ගුරු උපදේශිකා |

| | | |
|---|---|---|
| | - | එම්.එස්. විමලසූරිය මහතා<br>ගුරු උපදේශක |
| | - | අරුණ ඉන්දික වේරගල මහතා<br>ගුරු සේවය |
| භාෂා සංස්කරණය | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| පරිගණක වචන සැකසුම | - | ඉමේෂා කුමාරි |
| වෙබ් අඩවිය | - | www.nie.lk |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | ii |
| සංඥාපනය | iii |
| හැඳින්වීම | viii |
| මළගිය ඇත්තෝ නවකතාව | 1 |
| රත්නාවලී නාට්‍යය | 6 |
| පුරාතන ගද්‍ය | 9 |
| ගිරා සන්දේශය | 18 |
| කෙටිකතා | 24 |
| නූතන පද්‍ය | 35 |
| භාෂාව හා ව්‍යාකරණය | 54 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම | 32 |
| පාසල පාදක කරගත් ඇගයීම | 64 |

## 1.0 හැඳින්වීම

නිපුණතා පාදක කරගත් අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂය නිර්දේශානුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත. මෙහි ඇතුළත් තොරතුරු උසස් පෙළ සිංහල විෂය උගන්වනු ලබන ගුරු මහත්ම මහත්මීන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම පහසු කරවනු ඇත. විෂය නිර්දේශය ප්‍රධාන නිපුණතා 13කින් සමන්විත වෙයි. එයින් නිපුණතා 07ක් 12 වන ශ්‍රේණිය සඳහා වන අතර නිපුණතා 06ක් 13 වන ශ්‍රේණිය සඳහා වෙයි. එක් එක් නිපුණතාවලට අදාළ ව නිපුණතා මට්ටම් ඇතුළත් කර ඇත. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පහත සඳහන් ශීර්ෂ යටතේ සකස් කර ඇත.

1.0 නිපුණතා

විෂය නිර්දේශයේ 12 වන ශ්‍රේණිය සඳහා අදාළවන එක් එක් නිපුණතාව මේ යටතේ දක්වා ඇත.

2.0 නිපුණතා මට්ටම්

පූර්වෝක්ත නිපුණතාව කරා ළඟා විය හැකි නිපුණතා මට්ටම් මෙයට ඇතුළත් වෙයි..

3.0 කාලච්ඡේද එකතුව

ඉහත දැක්වූ නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී යෝජිත කාලච්ඡේද සංඛ්‍යාව සුදුසු පරිදි වෙනස් කර ගැනීමේ අවකාශ පවතී.

4.0 ඉගෙනුම්ඵල

එක් එක් නිපුණතාවට අදාළ ව සිංහල විෂය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අවසානයේ අපේක්ෂිත සිසු චර්යා වෙනස්කම් මේ යටතේ ඉදිරිපත් කර ඇත. අදාළ ක්‍රියාකාරකම් තක්සේරුකරණ නිර්ණායක වශයෙන් ද භාවිත කළ හැකි ය.

5.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්

එක් එක් නිපුණතා සාක්ෂාත් කරගැනීමට උපකාරීවන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා නිපුණතා මට්ටම්වලට අදාළ විෂය අන්තර්ගතය කෙටියෙන් මේ යටතේ දක්වා ඇත. විෂය අන්තර්ගතය පිළිබඳ කරුණු අවසානයේ අදාළ නිපුණතා මට්ටම් වෙත සිසුන් ළඟාකර ගැනීමට උපකාරීවන ක්‍රියාකාරකම් කීපයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාකාරකම් වෙන්කර ගැනීමේ දී නිර්මාණාත්මක නව ක්‍රියාකාරකම් සකස් කර ගැනීමේ ද අවකාශය ගුරු මහත්ම මහත්මීන් සතු කාර්යයකි.

6.0 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාකාරකම් අවසානයේ ඇගයීමක් ඉදිරිපත් කර ඇත. සිසු ගවේෂණය මගින් කරුණු රැස්කර ගැනීමට පෙළඹුමක් ඇතිවන පරිදි එම ඇගයුම් සැලසුම් කර තිබේ. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති ඇගයීම් පාසල් පාදක ඇගයීම් සඳහා යොදාගත යුතු ය. වාරයකට ඇගයීම් අවස්ථා 03 බැගින් වාරතුන සඳහා ඇගයීම් 09 ක් ඉදිරිපත් කර ඇත.

## 7.0 පරිශීලනීය ග්‍රන්ථ

එක් එක් නිපුණතා හා නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉදිරිපත් කර ඇති විෂය අන්තර්ගතය ප්‍රසාරණය කර ගැනීම සඳහා අවශ්‍ය ග්‍රන්ථ කිහිපයක් මේ යටතේ දක්වා ඇති අතර මේ කෘති අධ්‍යයනය කිරීමට සිසුන් පෙළඹවීමත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයේ දී එම කෘතිවල අන්තර්ගත කරුණු ආශ්‍රය කර ගැනීමත් ගුරු මහත්ම මහත්මීන්ගෙන් අපේක්ෂා කෙරේ.

**මළගිය ඇත්තෝ**

| | | |
|---|---|---|
| **නිපුණතාව 1.0** | **:** | නවකතා හා නවකතා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව මළගිය ඇත්තෝ නවකතාව විචාරයට ලක් කරයි |
| **නිපුණතා මට්ටම** | **:** | 1.1 නවකතාවක මූලික ලක්ෂණ විස්තර කරයි<br>1.2 සිංහල නවකතාවේ ආරම්භය හා විකාසය පැහැදිලි කරයි<br>1.3 නවකතාංග කෙරෙහි අවධානය යොමු කරමින් මළගිය ඇත්තෝ නවකතාව විචාරය කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | **:** | 40 යි. |

**ඉගෙනුම් ඵල**

- 'නවකතාව' යනු කුමක්දැයි නිර්වචනය කරයි.
- නවකතාවක මූලික ලක්ෂණ ඉදිරිපත් කරයි.
- නවකතාව, කෙටිකතාවෙන් වෙනස් වන අයුරු විස්තර කරයි.
- සිංහල නවකතාවේ ආරම්භය පිළිබඳ කරුණු පැහැදිලි කරයි.
- සිංහල නවකතා ඉතිහාසය සංක්ෂිප්ත ව විස්තර කරයි.
- 'මළගිය ඇත්තෝ' නවකතාව කියවයි.
- 'මළගිය ඇත්තෝ' නවකතාවේ කතා වස්තුව හඳුනාගෙන විස්තර කරයි.
- 'මළගිය ඇත්තෝ' නවකතාවේ භාෂාව, කතා වින්‍යාසය පිළිබඳ ගවේෂණය කළ තොරතුරු විචාරශීලී ව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

**තේමාව/ අනුභූතිය/ වස්තු විෂය**

"දෙවෙන්දොරා" නමැති සිංහල සිත්තරකු "නොරිකෝ" නමැති ජපන් තරුණියකට බැඳි ප්‍රේමයක් වටා ගොඩ නැගුණු කතා පුවත

**විෂය අන්තර්ගතය**

- කලාකරුවෙකුගේ ප්‍රේම වෘතාන්තයක් පිළිබිඹු කෙරෙන සරල ගද්‍ය කාව්‍යයකි.
- "දෙවොන්දොරා" සහ "නොරිකෝ" ගේ චරිත නිරූපණය කෙරේ.
- "නොරිකෝ" නමැති ජපන් කතක නිසා සිත්තරාගේ සිත්හි ඇති වූ සුන්දරත්වය විස්තර කෙරේ.
- මානව භක්තියෙන් යුතු සානුකම්පික සිත් ඇත්තෙකුගේ ස්වරූපය හෙළි කෙරේ.
- ජපන් සංස්කෘතිය හා සමකාලීන ජපන් සමාජයේ තොරතුරු බිඳක් අනාවරණය කෙරේ.

**චරිත නිරූපණය**

දෙවෙන්දොරාගේ චරිතය

සජීවී ස්වභාවයකින් නිරූපණය වී තිබේ.
සියුම් හැඟීම් ඇති කලාකරුවෙකු ලෙස නිරූපිත ය.
පාරිසරික වෙනස්කම් සමග නිරන්තර ඝට්ටනයට ලක්වන චරිතයකි.
සරල වූ ද සුන්දර වූ ද අධ්‍යාත්මයක පිවිතුරු බව මේ චරිතයෙන් නිරූපිතය.
දැඩි උපේක්ෂාවෙන් හා සංයමයෙන් යුතු ව චරිතය නිරූපණය කොට ඇත.
ජීවිතය සිතින් ආස්වාදය කරන සෞන්දර්යවාදී අදහස්වලින් පිරුණු චරිතයකි.

"නොරිකෝ"ගේ චරිතය

ඉතා සියුම් වින්දන ශක්තියක් ඇත්තියකි.
හැඟීම්බර මනසකින් යුක්ත ය.
සානුකම්පිත හදවතක් ඇත.
සරල ගති පැවතුම් හා සරල ජීවන රටා ඇත්තියකි.
සාම්ප්‍රදායික ජපන් සංස්කෘතික හරයන්හි සංකේතයක් ලෙස හැඳින්විය හැකි ය.
ඇතැම් විටෙක සිය සැබෑ හැඟීම් සඟවා ගනියි.
විටෙක ඇගේ සංකීර්ණ ගති පැවතුම් ද ඉස්මතු වෙයි.

**කතා වින්‍යාසය**

නව කතාවේ සියලු සිදුවීම් හා අවස්ථා මනා හේතුඵල සබඳතාවකින් යුතුව ගොඩනගා ඇත. නවකතාවේ නිරූපිත විවිධ සිදුවීම්වලට ඒ ඒ චරිතය සම්බන්ධ වන ආකාරය විශද කිරීමෙන් කතා වින්‍යාසය ගොඩනගාගත් ආකාරය පරීක්ෂා කළ හැකි ය.

**භාෂාව**

කාව්‍යාත්මක, භාවපූර්ණ බස් වහරක් නවකතාව පුරා ම භාවිත වේ. සංවාද හා ආඛ්‍යාන උචිත ලෙස යොදා ගෙන ඇත.

**ජීවන දෘෂ්ටිය**

මනුෂ්‍ය ජීවිතය දෙස උපේක්ෂා සහගත දෘෂ්ටියක් යොමු කෙරේ.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**
**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

සිංහල නවකතා ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්වන පහත සඳහන් නව කතාකරුවන්ගේ නවකතා ද ඇතුළත් වන සේ පොත් ප්‍රදර්ශනයක් පවත්වන්න. ඒ සඳහා පාසල් පුස්තකාලයාධිපති/පතිනියගේ සහයෝගය ලබා ගන්න.

සයිමන් සිල්වා
ඩබ්ලිව්.ඒ. සිල්වා
පියදාස සිරිසේන
ජී.බී. සේනානායක
මාර්ටින් වික්‍රමසිංහ
එදිරිවීර සරච්චන්ද්‍ර
ගුණදාස අමරසේකර
කේ. ජයතිලක

**පියවර 2**

එම ප්‍රදර්ශනයේ දී 'නවකතාව හා සිංහල නවකතාවේ විකාශය' යන මැයෙන් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන්න. එහි දී නවකතාව යනු කුමක්දැයි හඳුන්වමින් සිංහල නවකතාව හා එහි ඉතිහාසය පිළිබඳ දේශනයක් හෝ දේශන කිහිපයක් පවත්වන්න. ඒ සම්බන්ධ අත්පත්‍රිකාවක් සකස් කර සිසුන් වෙත ලබා දෙන්න.

**පියවර 3**

පොත් ප්‍රදර්ශනයට යොදාගත් නව කතා කියවීමට සිසුන් යොමු කර නවකතාව පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට සලස්වන්න.

**ක්‍රියාකාරකම 2**

නවකතාවක කලාත්මක ලක්ෂණ හඳුනා ගනිමු.

**පියවර 1**

මෙහි දී පහත දක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නවකතාව සඳහා යොදාගෙන ඇති දෘෂ්ටි කෝණය
- උපයෝගී කරගත් භාෂාව
- කතා සන්දර්භය
- සංකේත, අවස්ථා. සිද්ධි, චරිත ආදිය නිරූපණය
- නවකතාවෙන් කිසියම් දර්ශනයක් ඉදිරිපත් කිරිම

පියවර 2

සිසුන් විසින් ප්‍රදර්ශනය සඳහා යොදාගත් සිංහල නවකතාවල කලාත්මක ලක්ෂණ පහක් තෝරාගෙන එම  කලාත්මක ලක්ෂණ කාඩ් පත්වල සටහන් කරගෙන පැමිණීමට උපදෙස් දෙන්න. එක් නවකතාවක නමක් ඉදිරියේ තිරස් ලෙස සියලු කාඩ්පත් පෙළ ගස්වා ප්‍රදර්ශනය කරන්න. (රූප සටහන ආර්ශයට ගන්න. )

| | නවකතාවේ නම | නවකතාවේ නම | නවකතාවේ නම | නවකතාවේ නම | නවකතාවේ නම |
|---|---|---|---|---|---|
| කලාත්මක ලක්ෂණ | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

- සිසුන් ප්‍රදර්ශනය කළ කරුණු ඇසුරින් නවකතාවක කලාත්මක ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- කලාත්මක නවකතාවක මූලික ලක්ෂණ පිළිබඳ සටහනක් පිළියෙල කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 3** "මළගිය ඇත්තෝ" නවකතාවේ සන්දර්භය වටහා ගනිමු.

**පියවර 1**

- මළගිය ඇත්තෝ නවකතාවේ රසවත් කොටස් කීපයක් තෝරාගෙන ඒවා රසවත් ව ඉදිරිපත් කරමින් මළගිය ඇත්තෝ නවකතාව කියවීමට සිසුන් යොමු කරන්න.

**පියවර 2**

- නවකතාව කියවීමෙන් අනතුරුව නවකතාවේ කතා සන්දර්භය ආවරණය වන පරිදි ප්‍රශ්නාවලියක් සකස් කරන්න.
- එම ප්‍රශ්න සිසුන් වෙත ඉදිරිපත් කරමින් නවකතාවේ සන්දර්භය අනාවරණය කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3**

- වචන 350 ක උපරිමයකට යටත් ව නවකතාවේ සන්දර්භය ගවේෂණය කිරීමේ පැවරුමක සිසුන් නිරත කරවන්න.

**පියවර 5**

- පැවරුම් කාර්යයන් පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම.**

**පියවර 1**

සිංහල නවකතා ඉතිහාසය

පහත සඳහන් වගුව අනුව සිංහල නවකතා ඉතිහාසය පිළිබඳ තොරතුරු රැස් කරන්න.

| නවකතාවේ නම | පළවූ වර්ෂය | කතුවරයා | තේමාව | දෘෂ්ටිකෝණය | ප්‍රධාන චරිත |
|---|---|---|---|---|---|
| | | | | | |

**පියවර 2**

නවකතාව හා සිංහල නවකතාවේ විකාසය පිළිබඳ වචන 2000 කට නො අඩු රචනයක් නිර්මාණය කරන්න. එහි දී පහත සඳහන් තොරතුරු ඇතුළත් කරන්න.

- නවකතාව යනු කුමක් ද?
- සිංහල නවකතාව ආරම්භ වූ අයුරු
- සිංහල නවකතාවේ විකාසය

**පරිශීලනීය ග්‍රන්ථ**


සිංහල නවකතාවේ ඉතිහාසය හා විචාරය - එදිරිවීර සරච්චන්ද්‍ර
සිංහල නවකතාවේ විකාශය - සරත්චන්ද්‍ර වික්‍රමසූරිය
නවකතා කලාව - ජී.බී. සේනානායක
නවකතා නිර්මාණය හා අවබෝධය - ඒ.වී. සුරවීර
නිර්මාණ පසුබිම - සරත්චන්ද්‍ර වික්‍රමසූරිය
උපන්දා සිට - මාර්ටින් වික්‍රමසිංහ
පිං ඇති සරසවි වරක් දෙන්නේ - එදිරවීර සරච්චන්ද්‍ර
ප්‍රබන්ධ කථා මූලධර්ම - උදය ප්‍රශාන්ත මැද්දේගම
නූතන සිංහල සාහිත්‍යය - කේ.ඩී.පී. වික්‍රමසිංහ
මළවුන්ගේ අවුරුදු දා - එදිරිවීර සරච්චන්ද්‍ර
නොමළ චරිත - ඉන්ද්‍රපාල අබේවීර
සිංහල ප්‍රබන්ධ කථාවේ විකාශනය - තිස්ස කාරියවසම්
සිංහල නවකතාවේ ආරම්භය - ආරිය රාජකරුණා
නවකතාව හා සමාජය - කේ. ජයතිලක
සිංහල නවකතාවේ සංස්කෘතික පසුබිම - කේ. ජයතිලක

රත්නාවලී නාට්‍යය

| | | |
|---|---|---|
| **නිපුණතාව 2.0** | **:** | සංස්කෘත නාට්‍ය මූලධර්ම හඳුනාගෙන රත්නාවලී නාට්‍යය රස විඳියි |
| **නිපුණතා මට්ටම** | **:** | 2.1 සංස්කෘත නාට්‍ය කලාවේ ඉතිහාසය පැහැදිලි කරයි<br>2.2 සාහිත්‍යාංගයක් ලෙස නාට්‍ය කලාවේ විශේෂතා විස්තර කරයි<br>2.3 රත්නාවලී නාට්‍යයේ පෙළ කියවා අවබෝධ කර ගනියි<br>2.4 රත්නාවලී නාට්‍යයේ චරිත පිළිබඳ විග්‍රහයක යෙදෙයි<br>2.5 නාට්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතුව රත්නාවලී නාට්‍යය විචාරය කරයි |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | **:** | 40 යි. |

**ඉගෙනුම් ඵල**

- නාට්‍ය සාහිත්‍යයට විශේෂ වූ ලක්ෂණ විස්තර කරයි.
- සංස්කෘත නාට්‍ය කලාවේ මූලික ලක්ෂණ විස්තර කරයි.
- සංස්කෘත නාට්‍ය අංග කෙරෙහි සැලකිලිමත් වෙමින් රත්නාවලී නාට්‍යය විචාරය කරයි.
- රත්නාවලී නාට්‍යයේ කතා සාරය ඉදිරිපත් කරයි.
- රත්නාවලී නාට්‍යයේ නාට්‍යෝචිත අවස්ථා හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- රත්නාවලී නාට්‍යයේ නිරූපිත චරිතවල ලක්ෂණ ඉදිරිපත් කරයි.
- රත්නාවලී නාට්‍යයේ යොදාගෙන ඇති භාෂාව හඳුනාගනිමින් එහි සුවිශේෂතා පැහැදිලි කරයි.
- නාට්‍ය විචාර මූලධර්ම හඳුනාගෙන විස්තර කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

- සංස්කෘත දෘශ්‍යකාව්‍යයන්ගේ විශේෂ ලක්ෂණ
    - දෙබස් ගද්‍යයෙන් රචනාවීම.
    - කිසියම් දර්ශනයක පසුතලයක් මවාපෑමේ දී හෝ චරිතයක වූ හැඟීමක් ප්‍රකාශ කරන විට පද්‍ය යෙදීම.
    - චරිත අනුව භාෂාවේ විවිධත්වයක් දක්නට ලැබීම.
    - ස්ත්‍රී සහභාගිත්වය ඉහළින් පැවතීම.
    - නාට්‍ය ධර්මී හෙවත් ශෛලිගත රංග ශෛලිය භාවිත කිරීම.
    - ප්‍රස්තාවනාවකින් ආරම්භවීම.
    - විවිධ හේතූන් නිසා ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් නොකළ හැකි දේ දෙබස් මගින් හඳුන්වාදීම, නේපථ්‍යාගාරයේ සිට පාත්‍රයන් කරන ඇඟවීම් ආදි උපක්‍රම යොදා ගැනීම.
    - චතුර්විධ අභිනය භාවිත කිරීම
    - නාට්‍ය සන්දර්භය කොටස් පහකින් යුක්ත වීම

        ආරම්භ
        ප්‍රයත්න
        ප්‍රාප්ත්‍යාශා
        නියතාප්ති
        ඵලාගම

**රත්නාවලී නාට්‍යය**

ක්‍රි.ව. 7 වන සියවසේ භාරතීය නරපතියෙකු වූ ශ්‍රී හර්ෂ විසින් ලියන ලද කෘතියකි.
නාගානන්ද, ප්‍රියදර්ශිකා යනු ඔහු විසින් ලියන ලද තවත් නාට්‍ය කෘති දෙකකි.
රත්නාවලී නාට්‍යයට පාලි සාහිත්‍යයේ සඳහන් වත්ස රාජ චරිතය වස්තු බීජය වී ඇත.
මෙය අංක 4 කින් යුත් දෘශ්‍ය කාව්‍යයකි.
පසුකාලීන නාට්‍ය විචාරකයින් සංස්කෘත නාට්‍ය සිද්ධාන්තවලට උදාහරණ දැක්වීමේ දී රත්නාවලිය බොහෝ සෙයින් ඉවහල් කරගෙන ඇත.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1** - සංස්කෘත නාට්‍ය කලාව හඳුනා ගැනීම.

**පියවර 1**

පුස්තකාල භාවිතය මගින් සංස්කෘත නාට්‍ය කලාව පිළිබඳ තොරතුරු ගවේෂණයක සිසුන් නිරත කරවන්න.

ඒ ඇසුරින් පහත සඳහන් තේමා යටතේ කරුණු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

- නාට්‍යය කලාව යනු කුමක් ද?
- නාට්‍ය කලාවේ විවිධ ලක්ෂණ හා සම්ප්‍රදායන්
- සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ විශේෂ ලක්ෂණ
- සංස්කෘත නාට්‍ය විචාර මූලධර්ම

**පියවර 2**

සිසුන් විසින් රැස්කරගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

සිසුන් ඉදිරිපත් කළ කරුණු ද සැලකිල්ලට ගනිමින් සංස්කෘත නාට්‍ය සාහිත්‍යය පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 2** - රත්නාවලී නාට්‍ය විචාරය

**පියවර 1**

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් හතරකට බෙදන්න.

සෑම කණ්ඩායමක් ම නාට්‍යයේ පළමුවන අංකය කියවා පහත සඳහන් තේමා යටතේ කරුණු ගවේෂණයක නිතර කරවන්න.

- නාට්‍යයේ පෙළ කියවීම.
- කතා සාරය ගොඩනැගීම.
- ප්‍රධාන සිද්ධි හා අවස්ථා අනුපිළිවෙළින් පෙළ ගැස්වීම.
- චරිත හා සිදුවීම් පිළිබඳ විචාරශීලී අදහස් දැක්වීම.

ගවේෂණය කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.

උචිත පරිදි සමාලෝචනයක යෙදීම.

**පියවර 2**

නාට්‍යයේ දෙවන, තෙවන හා සිව්වන අංක සඳහා ද පළමු පියවරේ දී අනුගමනය කළ ක්‍රමවේදය ම භාවිත කරන්න.

**පියවර 3**

සංස්කෘත නාට්‍ය විචාර මූලධර්ම පිළිබඳ තවදුරටත් කරුණු ගවේෂණය කරන්න.

**ඇගයීම.**

**පියවර 1**

සංස්කෘත දෘශ්‍යකාව්‍යවල විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

පහත සඳහන් කරුණු ඔස්සේ පිළිතුරු ගොනු කරන්න.

- භාෂාව
- දෙබස් භාවිතය
- ශෛලිගත රංග සම්ප්‍රදාය
- විවිධ කථන ක්‍රම භාවිතය

**පරිශීලනීය ග්‍රන්ථ**

නාට්‍ය දෘෂ්ටිය හා රත්නාවලි - එම්.එච්. ගුණතිලක
සිංහල ගැමි නාටකය (පළමු පරිච්ඡේදය) - එදිරිවීර සරච්චන්ද්‍ර
නාට්‍ය ගවේෂණ - එදිරිවීර සරච්චන්ද්‍ර
වෙස් මුහුණ ද සැබෑ මුහුණු ද - එදිරිවීර සරච්චන්ද්‍ර
කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර
සාහිත්‍යය - නාට්‍ය පිළිබඳ විශේෂ කලාපය
සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදනය - සුගතපාල ද සිල්වා
මැටි කරත්තය (සංස්කෘත නාට්‍යයේ රංගශෛලිය නැමැති ලිපිය) - පියදාස නිශ්ශංක
නාට්‍ය ප්‍රවේශය - සුචරිත ගම්ලත්
සංස්කෘත නාට්‍ය සාහිත්‍යය - ජයදේව තිලකසිරි
භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍ර - වෝල්ටර් මාරසිංහ
සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය හා රත්නාවලී - වෝල්ටර් මාරසිංහ
සිංහල නාට්‍ය විකාසනය - තිස්ස කාරියවසම්
විශ්ව විද්‍යාල කාව්‍ය වංසය - තිස්ස කාරියවසම්
විසි වසරක සිංහල නාට්‍ය ඉතිහාසය - තිස්ස කාරියවසම්
විසි පස් වසරක නාට්‍ය ඉතිහාසය - තිස්ස කාරියවසම්

**පුරාතන ගද්‍ය - සද්ධර්මරත්නාවලිය**

**නිපුණතාව 3.0** : පුරාතන ගද්‍ය සාහිත්‍ය පරිශීලනයෙන් ලබා ගත් ජීවිත පරිඥානය හා භාෂා පරිචය නිර්මාණාත්මක භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි

**නිපුණතා මට්ටම** : 3.1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ඉතිහාසය පැහැදිලි කරයි
3.2 නිර්දිෂ්ට කතාවන්හි දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරයි
3.3 සද්ධර්මරත්නාවලියේ අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය හඳුනාගෙන විග්‍රහ කරයි
3.4 පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය හඳුනාගෙන විග්‍රහ කරයි
3.5 සද්ධර්මාලංකාරයෙහි අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය හඳුනාගෙන විග්‍රහ කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : 40 යි.

**ඉගෙනුම් ඵල**

- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ කිහිපයක් ගෙන හැර දක්වයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍යයෙහි යුග අනුව ඇති වූ විකාශය සැකෙවින් පැහැදිලි කරයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන ගද්‍ය සාහිත්‍ය කොටස් කියවයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආකෘතිය, භාෂා ශෛලිය, රචනෝපක්‍රම හඳුනාගෙන විචාරය කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණවල අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය හඳුනාගෙන විමර්ශනය කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

- පුරාතන සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යය
  - සිංහල සාහිත්‍ය ඉතිහාසය යුග වශයෙන් මෙසේ බෙදා දැක්විය හැකි ය.

    අනුරාධපුර (ක්‍රි.පූ. 437 - ක්‍රි.ව. 1058)
    පොලොන්නරු (ක්‍රි.ව. 1058 - ක්‍රි.ව. 1234)
    දඹදෙණි (ක්‍රි.ව. 1220 - ක්‍රි.ව. 1293)
    කුරුණෑගල (ක්‍රි.ව. 1293 - ක්‍රි.ව. 1347)
    ගම්පොළ (ක්‍රි.ව. 1347 - ක්‍රි.ව. 1412)
    කෝට්ටේ (ක්‍රි.ව. 1412 - ක්‍රි.ව. 1580)
    සීතාවක (ක්‍රි.ව. 1580 - ක්‍රි.ව. 1592)
    මහනුවර (ක්‍රි.ව. 1480 - ක්‍රි.ව. 1815)
    කොළඹ ක්‍රි.ව. 1815 සිට

• නිර්දිෂ්ට ගද්‍ය කෘති මේ යුග යටතේ අන්තර්ගත කිරීම.

• පුරාතන ගද්‍ය සාහිත්‍යයෙහි ස්වභාවය
  - බුදු සිරිත වස්තු බීජ කොට ගැනීම.
  - කතුවරුන්ගෙන් බොහොමයක් භික්ෂූන් වහන්සේලාවීම.
  - බණකථා සාහිත්‍යයක් අන්තර්ගත වීම.
  - ශ්‍රැතිගෝචර ශෛලියෙන් ලියවී තිබීම.
  - ඒ ඒ යුගයට අයත් භාෂා ලක්ෂණ, පිළිබිඹු වීම.
  - බොහෝ ග්‍රන්ථ මිශ්‍ර සිංහල භාෂාවෙන් ලියවී තිබීම.

• සද්ධර්මරත්නාවලිය
  - කතුවරයා ධර්මසේන නම් යතිවරයෙකු බව ග්‍රන්ථාවසානයේ සඳහන් ගාථාවකින් කියැවේ.
  - දඹදෙණි යුගයට අයත් ගද්‍ය කාව්‍යයකි.
  - පාලි ධම්මපදට්ඨ කතාවේ පදානුගත පරිවර්තනයක් නොව අනුවාදයකි.
  - ශ්‍රාවකයන් සච්චාරිත්‍ර ධර්මයන්හි පිහිටුවීම කර්තෘගේ අරමුණයි.
  - ගැමි වහරින් පෝෂිත බසක් උපයෝගී කර ගෙන ඇත.
  - කතුවරයාගේ උපමා යෙදීමේ ශක්තිය අනාවරණය වේ.

පටාචාරා වහන්දෑගේ වස්තුව
- කතාවේ අන්තර්ගතය

  සිටු කුමරියක වූ පටාචාරාව සිටු මැදුරක සැපවත් ජීවිතයක් ගත කිරීම.
  ඇය රැකබලා ගැනීමට දෙමව්පියන් ගත් උත්සාහය
  සිටු මැදුරේ සේවකයකු සමග මිත්‍ර වීම
  ඔහු සමග රහසින් පැන යෑම
  පටාචාරාවගේ පළමු දරු ප්‍රසූතිය
  ඇගේ දෙවන දරු ප්‍රසූතිය සඳහා දෙමවුපියන් වෙත යෑමට පිටත් වීම.
  අතරමගදී දරු ප්‍රසූතිය සිදුවීම, අකාල මේඝය, සැමියගේ අකාල මරණය
    සිය ඇස් හමුවේ දරුවන් දෙදෙනා මිය යෑම
    දෙමවුපියන්ගේ හදිසි මරණය
    පටාචාරාව උමතුවීම
    බුදුරදුන් වෙත පැමිණ ආධ්‍යාත්මික සුවය ලැබීම

චරිත නිරූපණය ඃ

පටාචාරා - හැඟීම්වලට වහල් වී තීරණ ගැනීමෙන් හා ඒ අනුව කටයුතු කිරීමෙන් ඛේදජනක ඉරණමකට මුහුණ දුන් කාන්තාවකගේ චරිතයකි. හේතුඵල සම්බන්ධතාව අනුව විකාශය වන චරිතයකි. සජීවී චරිත නිරූපණය දැකිය හැක.

හද්‍ර යෞවනයේ සිරකාරියක ලෙස ජීවත්වීමට සිදුවීම.
ආදරය ආලය පිළිබඳ හැඟීම් පිබිදීම.
සේවකයා කෙරෙහි ආලයෙන් සිටු සම්පත් හැර යෑම.
ඔහු සමග සතුටින් ජීවත්වීම.
අනපේක්ෂිත ඛේදවාචකයට මුහුණදීමට සිදුවීම.
දරාගත නොහැකි චිත්ත පීඩනය හේතුවෙන් උමතු බවට පත්වීම.

මෙහෙකරු - ඔහු තමා අතින් සිදුවූයේ බලවත් වරදක් බව සිතයි. දරු ප්‍රසූතිය සඳහා දෙමවුපියන් වෙත යෑමේ අදහසට ඔහු එකඟ නොවන්නේ වරදට දඬුවම්

ලැබෙතැයි බියෙනි. ඔහු සැමියෙකු ලෙස භක්තිමත් ව පටාචාරාව රැක බලා ගත්තේ ය.

**අවස්ථා නිරූපණය ඃ**

සිටුකුමරිය මෙහෙකරු සමග පලායන අවස්ථාව
පළමු දරු ප්‍රසූතිය සිදුවන අවස්ථාව
දෙවන දරු ප්‍රසූතිය සිදුවන අවස්ථාව
සැමියා මිය ගිය බව දැනගත් අවස්ථාව
ගංවතුර හේතුවෙන් දරුවන් අහිමි වූ අවස්ථාව
දෙමවුපියන්ගේ හදිසි මරණය සැල වූ අවස්ථාව

යන තන්හි දී කතුවරයා අවස්ථා නිරූපණයෙහිලා දක්වන කුසලතාව ඉස්මතු කර දැක්වීම වැදගත් වේ. ප්‍රසව වේදනාවක් සමග අකාල මේඝයක් ඇතිවීම හා සැසඳීම.

**භාෂා ශෛලිය**

අවස්ථා හා චරිත නිරූපණයේ දී සාර්ථක ලෙස භාෂාව යොදාගෙන ඇති ආකාරය.
උපමා භාවිතය - "රෙදි කඩකින් වසා ලූ මැණිකක් පරිද්දෙන්.."
"පිට පිට හෙලා අකුණු පහරන්නා සේ..."
බණ කතා රීතිය
ජන වහර යොදා ගැනීම

**කතුවරයාගේ ජීවන දෘෂ්ටිය**

මානව දයාවෙන් යුතු ව පටාචාරාවන් දෙස හෙළන්නේ සානුකම්පි දෘෂ්ටියකි.

**ඇගයීම**

පටාචාරා වහන්දැගේ වස්තුවේ අවස්ථා නිරූපණයේ දී කතුවරයා දක්වා ඇති දක්ෂතාව
පළමු දරු ප්‍රසූතිය
දෙවන දරු ප්‍රසූතිය
සැමියා මියයාම
ගංවතුර නිසා දරුවන් අහිමිවීම යන අවස්ථා ඔස්සේ පැහැදිලි කරන්න.

**පන්සිය පනස් ජාතක පොත**

- මෙහි කර්තෘ පිළිබඳ මත භේද පවතී. එක් කතුවරයෙකු නොව කර්තෘ මණ්ඩලයක් විසින් කරන ලදැයි යන්න අදහසකි.

- ජාතක පොතේ ප්‍රස්තාවනාවේ මෙසේ දැක්වේ.

  "පන්සිය පනස් ජාතක ධර්ම දේශනාව එළුවෙන් දක්වන්නට වුවමනායැයි කියා පරාක්‍රම නම් ඇමැති සත්පුරුෂයාගේ ආරාධනාවෙන් හා වීරසිංහ පතිරාජ නම් අමාත්‍යෝත්තමයාගේ උත්සාහයෙන් අටුවා සාමින් ලියූ ජාතක නියාව නො වරදවා එළුවෙන් ලිය වූ ජාතක කථාව සත්පුරුෂ මනුෂ්‍යයින් විසින් කන් යොමා සිත් හිලා ඇසිය යුතු."

- කාලය කුරුණෑගල සාහිත්‍ය යුගයට අයත් ය.
- මූලාශ්‍රය පාලි ජාතකට්ඨකතාවයි.
- බුදුරදුන්ගේ අතීත ජන්ම පිළිබඳ කතා ඇතුළත් ය.
- සෑම කතාවක් ම සාහිත්‍ය රසයෙන් අනූන වන අතර ගත හැකි ජීවිතාදර්ශ ද බොහොමයකි.

**ඡද්දන්ත ජාතකය**

අරමුණ ඃ

බෝසතුන්ගේ දාන පාරමිතා ගුණය ප්‍රකට කිරීම

වර්තමාන කතාව

තරුණ භික්ෂුණියක බුදුරදුන්ගේ රුව දැක සිනාසීම හා හැඬීම

අතීත කතාව

ඡද්දන්ත ඇතු, විල හා වනය පිළිබඳ වැනුම
චුල්ල සුභද්‍රා හා මහා සුභද්‍රා ඇතින්නියන් පිළිබඳ තොරතුරු
චුල්ල සුභද්‍රාවගේ සපත්නීරෝෂය
ඇගේ වෛරය හා ප්‍රාර්ථනාව
චුල්ල සුභද්‍රාවගේ අනතුරු ජන්මය
ඇගේ දොළදුක
සෝනුත්තර වැද්දා ඡද්දන්ත ඇතු සොයා යෑම
උපක්‍රමශීලී ව ඇතු විදීම
වැද්දා කෙරෙහි අනුකම්පා කිරීම හා දළ දන්දීම
චුල්ල සුභද්‍රාවගේ මරණය
සමෝධානය

චරිත නිරූපණ

ඡද්දන්ත ඇතු
මහා සත්ත්වයෙකුගේ චරිත ලක්ෂණ
රූපකාය සම්පත්තිය
තේජාන්විත බව
බෝධිසත්ත්ව ගුණ

චුල්ල සුභද්‍රා
බිරිඳකගේ සපත්නීරෝෂය ප්‍රකට කරන චරිත ලක්ෂණ
මහා සුභද්‍රා පිළිබඳ ඊර්ෂ්‍යාව
ස්වාමියා පිළිබඳ වෛරය
පළිගැනීමේ චේතනාව හා ප්‍රාර්ථනය
කාර්ය සාධනයෙහි උත්සාහවත් බව

අවස්ථා නිරූපණ

චුල්ල සුභද්‍රාවගේ සපත්නීරෝෂය ඉස්මතු වන අවස්ථා
සුභද්‍රාගේ දොළදුක
සෝනුත්තර වැදි පුත්‍රයා ඇතු විදීම හා දළ කැපීම
සුභද්‍රා පසුතැවිලි වීම ආදි අවස්ථාවන් චිත්තරූප මැවෙන ආකාරයෙන් විවරණය කොට ඇති අයුරු විමසීම.
වඩාත් සංවේදී අවස්ථාවන් පිළිබඳ අවධානය යොමු කිරීම.

වර්ණනා

ඡද්දන්ත ඇතා
විල
වනය

භාෂා ලක්ෂණ

මිශ්‍ර භාෂා ලක්ෂණ
උපමා රූපකාදී අලංකාර භාවිතය
වර්ණනාත්මක ශෛලිය (ශ්‍රැතිගෝචර)
දීර්ඝ වාක්‍ය
කෙටි වාක්‍ය

ඇගයීම

සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
ඡද්දන්ත ජාතක කතාවේ එන වර්ණනා හඳුනාගන්නට සලස්වන්න.
එම වර්ණනා සිසු කණ්ඩායම්වලට ලබා දී ඒ පිළිබඳ ව ඇගයීමක් කිරීමට යොමු කරන්න.
ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
සිසු අදහස් ද ලබාගෙන සමාලෝචනයක නිරතවන්න.

**ගණ්ඩ තින්දු ජාතකය**

කතාවේ අරමුණ ඃ

දස රාජ ධර්මයෙන් රාජ්‍ය පාලනයෙහි අගය වටහාදීම.

වර්තමාන කතාව

රජෝවාද ජාතකය කියවන්න.

අතීත කතාව

කම්පිල්ල රට උත්තර පඤ්චාල නුවර පඤ්චාල රජ්ජුරුවන්ගේ අධාර්මික රාජ්‍ය පාලනය
යුව රජ සෙනෙවිරත් ආදිහු දනව් වැසියන් පීඩාවට පත් කරමින් අයබදු ගැනීම
රටවැසියෝ ඔවුන්ට බියේ වල් වැදීම.
මේ බව දුටු බෝසත් රුක් දෙවි රජුට අවවාද දෙයි
දිව්‍ය පුත්‍රයාගෙන් කරුණු දැනගත් රජ්ජුරුවෝ වෙස්වලාගෙන පුරෝහිත බමුණා සමග
විවිධ තැන්වල ඇවිදිති
රාජ පුරුෂයන්ට බියේ වල් වැදුණු පුරුෂයෙකු තමාගේ ගෙයි දොර කටු කොහෙලින් වසා
ගොස් පසු දින කටු කොහොල් හරින අවස්ථාවේ දී කටුවක් ඇනෙයි. කටුව ඉවතට
ගන්නා අවස්ථාවේ දී රජ්ජුරුවන්ට දොස් කියයි. වෙස්වලාගෙන පැමිණි රජ්ජුරුවන්ට එය
ඇසෙයි. වලට වැද දර, පලා විකොට ජීවත්වන එක ස්ත්‍රියක් වලට වැද පලා කඩන විට
අත වැරදී ගොස් බිම හෙව කඳුළු පිසදමමින් රජ්ජුරුවන්ට ආක්‍රෝෂ කිරීම,
නගුලෙහි සී වැල ඇනී පස තුවාල වූ ගොනු නගුල ඇදීමට අපොහොසත් වීම නිසා
ගොවියෙකු ඒ පිළිබඳ ව රජුට දොස් කීම.

රාජ සේවකයන්ගේ අණින් බොහෝ කොට කිරි ගෙනෙන ලෙස කළ ඉල්ලීම නිසා කුළු
දෙනෙකගෙන් කිරි දෙවීමට ගත් උත්සාහයේ දී කුළුදෙනගේ පහර කෑ ගොපල්ලා රජුට
බැණ වැදීම.

එළ දෙනකගේ වස්සෙකු මැරූ හෙයින් දෙනක තණ පැන් නොකා රජ්ජුරුවන්ට දොස් නැඟීම.
වතුර සිඳුණු පොකුණක මැඩියෙකු වතුර සිඳීම නිසා මැඩියන්ට සිදුවන කරදර පවසමින් රජ්ජුරුවන්ට දොස් කීම.
කරුණු තේරුම් ගන්නා රජ්ජුරුවන් ධාර්මික රාජ්‍ය පාලනයට යොමුවීම.

චරිත නිරූපණය

පඤ්චාල රජ්ජුරුවෝ

යුවරජවරු

නිලධාරින්

සේවකයන්

අවස්ථා නිරූපණය

රජුට මුණ ගැසෙන විවිධ පුද්ගලයින් හා සත්ත්වයින් මුහුණදෙන දුක් ගැහැට

වර්ණනා

රුක් දෙවියන් රජ්ජුරුවන්ට අනුශාසනා කිරීම

භාෂා ලක්ෂණ

වර්ණනාත්මක භාෂාව

ප්‍රාණවත් දෙබස්

උපමා භාවිතය

මිශ්‍ර භාෂා ලක්ෂණ

ඇගයීම

සිසුන් කණ්ඩායම් දෙකකට වෙන්කරන්න.

රජුගේ අවිචාරවත් රාජ්‍ය පාලනය ඉදිරිපත් කිරීමට කතුවරයා යෙදූ උපක්‍රම පිළිබඳ සිසුන් කණ්ඩායම් දෙක අතර සංවාදයක් ඇති කරවන්න. සංවාදයේ දී මතුවන වැදගත් කරුණු සටහන් කර ගැනීමට

උපදෙස් දෙන්න.

සටහන් කරගත් කරුණු අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකු මගින් පන්තියට ඉදිරිපත් කරවන්න.

ඉදිරිපත් කළ කරුණු ද සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

සද්ධර්මාලංකාරය

- කතුවරයා - ගඩලාදෙණි විහාරාධිපතිව වැඩ විසූ ජයබාහු දේවරක්ඛිත හිමියන්
- කාලය - 14 වන ශතවර්ෂය - ගම්පොළ සාහිත්‍යය යුගය
- මූලාශ්‍රය - රසවාහිනී නම් වූ පාලි ග්‍රන්ථය
- අන්තර්ගතය - කතා වස්තු 24 කි. එයින් 12 ක් දඹදිව පසුබිම් කරගත් කතාය. අනෙක් කතා 12 ලංකාව පසුබිම් කොට ගත් ඒවා ය.
- ඓතිහාසික සමාජ තොරතුරු - ශ්‍රී ලංකාවේ පැරණි ඓතිහාසික හා සමාජ තොරතුරු හෙළි කරන මූලාශ්‍ර ග්‍රන්ථයක් වශයෙන් අගය කළ හැකි ය.
- රීතිය - ජනප්‍රිය ධර්ම දේශනා රීතිය අනුගමනය කරමින් රචිත මහා බණ පොතකි.

- සාලිරාජ වස්තුව

කතාවේ අන්තර්ගතය

- දුටුගැමුණු රජ පුත් සාලිය කුමරා හා අශෝකමාලා පිළිබඳ ප්‍රේම වෘත්තාන්තය කතාවට ඇතුළත් වේ.

කතා වින්‍යාසය

- සාලිය කුමරුගේ අතීත ජන්මය පිළිබඳ කතාව
- දුටුගැමුණු මහ රජුට පුත්ව ඉපදීම
- යුවරජ තනතුර ලැබීම සහ කරන ලද පින් දහම
- අශෝකමාලා හමුවීම
- අශෝකමාලාවගේ අතීත ජන්මය පිළිබඳ කතාව
- අශෝකමාලා චණ්ඩාල කුලයක ඉපදීම
- දුටුගැමුණු රජුගේ විරෝධය සහ ප්‍රසාදය
- සාලිය අශෝකමාලා විවාහය සහ රජකම ප්‍රතික්ෂේප කිරීම

චරිත නිරූපණය

- සාලිය අශෝකමාලා, දුටුගැමුණු රජු මෙහි ප්‍රධාන චරිතයෝ වෙති.

සාලිය කුමරුගේ චරිතය

- පිනට දහමට ලැදි බව
- ප්‍රේම  ය පිළිබඳ අචල ස්ථාවරයක පැවතීම
- රාජ්‍ය ලෝභයෙන් තොරවීම
- කුල භේදය නොසැලකීම

අශෝකමාලා චරිතය

- රූමත් බව
- නිහතමානී බව
- පති භක්තිය
- ආගන්තුක සත්කාරයෙහි ලැදි බව

දුටුගැමුණු රජ චරිතය

- මානව හිතවාදී බව
- විමර්ශනශීලී බව
- පුතු සෙනෙහස
- ඉවසීම

වර්ණනා

- අශෝකමාලාවගේ රූප සම්පත්තිය මුල් කරගෙන ස්ත්‍රී ලාලිත්‍යය පිළිබඳ කරන විසිතුරු වර්ණනා දෙකකි.
- උද්‍යාන වර්ණනාවක් ඇතුළත් ය

අවස්ථා නිරූපණය
- සාලිය අශෝකමාලා හමුව
- දුටු ගැමුණු රජු සාලිය අශෝකමාලා හමුවූ අවස්ථාව

භාෂා ලක්ෂණ
- සංස්කෘත තත්සම ශබ්ද සහිත මිශ්‍ර භාෂා ලක්ෂණ
- දිගු වැකි, කෙටි වැකි භාවිතය

රචනා ශෛලිය
- ශ්‍රැති ගෝචර ධර්ම දේශනා ශෛලිය
- වර්ණනාත්මක ශෛලිය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම** 1 - පන්සිය පනස් ජාතක පොත පිළිබඳ තොරතුරු රැස් කිරීම.

**පියවර** 1

ජාතක කතාවක කොටසක්, උචිත ක්‍රමවේදයක් මගින් ශ්‍රවණය කිරීමට සැලැස්වීමෙන් පාඩමට ප්‍රවේශ වන්න.

**පියවර** 2

පන්සිය පනස් ජාතක පොත පිළිබඳ ව මූලික තොරතුරු රැස් කිරීමට සිසුන්ට පවරන්න.
- කර්තෘ
- කාලය
- අරමුණ
- වස්තු විෂය ආදිය පිළිබඳව

සොයාගත් කරුණු එකතු කර කුඩා පත්‍රිකාවක් සකස් කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර** 3

සොයා ගත් කරුණු ඉදිරිපත් කිරිමට අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුට අවස්ථාව සලසන්න.

සිසුන් ඉදිරිපත් කළ කරුණු ද අදාළ කරගෙන පන්සිය පනස් ජාතක පොත හා නිර්දිෂ්ට ජාතක කතා පිළිබඳ ව කෙටි සමාලෝචනයක් කරන්න.

මෙම ක්‍රියාකාරකම සද්ධර්මරත්නාවලිය හා සද්ධර්මාලංකාරය ග්‍රන්ථ පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා ද භාවිත කළ හැකි ය.

**ක්‍රියාකාරකම** 2 - දුරවබෝධ වචනාර්ථ පැහැදිලි කිරීම.

**පියවර** 1

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. නිර්දිෂ්ට පුරාතන ගද්‍ය එක් එක් කණ්ඩායමට ලබා දෙන්න.
- පටාචාරා වහන්දැගේ වස්තුව
- ෂද්දන්ත ජාතකය
- ගණ්ඩතින්දු ජාතකය
- සාලිරාජ වස්තුව

**පියවර 2**

එක් එක් කණ්ඩායමට ලැබුණු කතා වස්තුවල දුරවබෝධ වචන ලැයිස්තුගත කිරීමට අවස්ථාව සලසන්න.

ශබ්දකෝෂ පරිහරණය මගින් දුරවබෝධ වචන සඳහා අරුත් සපයා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම් කරන්න.

**පියවර 3**

කණ්ඩායම් සොයාගත් දුරවබෝධ වචනාර්ථ පැහැදිලි කිරීම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

**පියවර 4**

ගවේෂණය මගින් සිසුන් සොයාගත් දුරවබෝධ වචනාර්ථ පැහැදිලි කිරීම් ඇසුරින් පොත් පිංච බැගින් සකස් කිරීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

**පියවර 5**

සිසු ඉදිරිපත් කිරීම් ද සැලකිල්ලට ගෙන සමාලෝචනයක නිරත වන්න.

**ක්‍රියාකාරකම 3 - නිර්දිෂ්ට කතා විචාරය කිරීම**

**පියවර 1**

පුරාතන ගද්‍ය සාහිත්‍ය යටතේ නිර්දිෂ්ට එක් කතා ප්‍රවෘත්තියක කතා සාරය පන්තියට ඉදිරිපත් කරන්න.

**පියවර 2**

එම කතාව තවදුරටත් අධ්‍යයනය කොට පහත සඳහන් තේමා යටතේ තොරතුරු ගවේෂණයක සිසුන් නිරත කරවන්න. (ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටීනම් කණ්ඩායම් ක්‍රමය මේ සඳහා යොදා ගන්න.)

කතුවරයාගේ අරමුණු
භාෂා ශෛලිය
කතා වින්‍යාසය
අවස්ථා නිරූපණය
චරිත නිරූපණය
කතුවරයාගේ ජීවන දෘෂ්ටිය

ආදි අංග පිළිබඳ කෙටි විස්තර සටහන් කර ගැනීමට යොමු කරන්න.

**පියවර 3**

සිසු ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

**පියවර 4**

සිසු ඉදිරිපත් කිරීම් ද සැලකිල්ලට ගෙන කෙටි සමාලෝචනයක යෙදෙන්න.

අනෙකුත් කතා සඳහා ද මේ ක්‍රමය යොදා ගත හැකි ය.

**ක්‍රියාකාරකම 4 - සාහිත්‍ය විචාරය**

**පියවර 1**

පන්තියේ විවාදයක් පැවැත්වීම සඳහා සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදා යෝජක සහ ප්‍රතියෝජක කණ්ඩායම් සකස් කර ගන්න.

පහත සඳහන් මාතෘකාවලින් එකක් පිළිබඳ කරුණු ගවේෂණය

සද්ධර්මරත්නාවලිය ධර්ම ග්‍රන්ථයකට වඩා සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස අගය කළ හැකි ය.

සිංහල සාහිත්‍යයේ පෝෂණයට වඩාත් ඉවහල් වූයේ ජාතක පොතයි.

තෝරාගත් මාතෘකාවට අනුව විවාදය පැවැත්වීමට අවශ්‍ය කරුණු ගවේෂණයක සිසුන් නිරත කරවන්න.

**පියවර 2**

පන්තියේ කණ්ඩායම් දෙක අතර විවාදයේ පළමු වටය පැවැත්වීමට අවස්ථාව ලබා දෙන්න.

විනිශ්චය මණ්ඩලයක සහාය ලබා ගන්න.

**පියවර 3**

පෙර ලෙසට ඉතිරි වූ මාතෘකාවට අනුව කරුණු ගවේෂණය කොට විවාදයක් පවත්වන්න.

**පියවර 4**

සිසුන් ඉදිරිපත් කළ කරුණු ද සැලකිල්ලට ගෙන සමාලෝචනයක යෙදෙන්න.

මධ්‍යස්ථ ව සාහිත්‍ය විචාරයක යෙදීමට සිසුන්ට උපදෙස් දෙන්න.

ඇගයීම

සද්ධර්මරත්නාවලිය ජාතක කතා සහ සද්ධර්මාලංකාරය අදාළ කතාවල ඡේද කීපයක් ඇසුරෙන් අවබෝධය සඳහා ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරන්න.

දුරවබෝධ වචන කිහිපයක් වෙන් කොට ඒවායෙහි අර්ථ දැක්වීමට අවස්ථාව දෙන්න.

පරිශීලනීය ග්‍රන්ථ


පන්සිය පනස් ජාතක පොත

| | |
|---|---|
| බණ කතා සාහිත්‍යය | - මාර්ටින් වික්‍රමසිංහ |
| ජාතක කතා විමසුම | - මාර්ටින් වික්‍රමසිංහ |
| සිංහල සාහිත්‍යයේ නැඟීම | - මාර්ටින් වික්‍රමසිංහ |
| සාහිත්‍ය ලිපි | - ඩී.බී. ජයතිලක |
| සිංහල සාහිත්‍ය II, III | - ආනන්ද කුලසූරිය |
| සාහිත්‍ය කතා | - කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි |
| සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය | - ඒ.වී. සුරවීර |
| සිංහල කතා කලාවේ විකාසය | - කේ. ජයතිලක |

**ගිරා සන්දේශය**

**නිපුණතාව 4.0** : ගිරා සන්දේශය පරිශීලනය කරමින් සන්දේශ සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක යෙදෙයි

**නිපුණතා මට්ටම** : 4.1 සන්දේශ කාව්‍ය සාහිත්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි
4.2 සන්දේශ කාව්‍යයක ලක්ෂණ ඉදිරිපත් කරයි
4.3 ගිරා සන්දේශය පරිශීලනය කරමින් රසාස්වාදයේ යෙදෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 40 යි.

**ඉගෙනුම් ඵල**

- සෙසු පද්‍ය සාහිත්‍ය නිර්මාණ අතරින් සන්දේශ සාහිත්‍ය වෙන් කොට හඳුනාගෙන විස්තර කරයි.
- සන්දේශ කාව්‍යයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- සන්දේශ සාහිත්‍යයේ විකාශය පැහැදිලි කරයි.
- කෝට්ටේ යුගයේ සන්දේශ සාහිත්‍යයේ විශේෂතා මතු කර දක්වයි.
- ගිරා සන්දේශයේ කවි කියවා අවබෝධයෙන් යුතුව අර්ථය ලිහිල් බසින් ලියා දක්වයි.
- ගිරා සන්දේශයේ පද්‍ය ගායනා කරමින් රස විඳියි.
- ගිරා සන්දේශයේ එන වර්ණනා අගයමින් ඒවායේ සුවිශේෂතා ගෙනහැර දක්වයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

සිංහල සන්දේශ සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය

- ගම්පොළ යුගය
    - මයුර සන්දේශය (ක්‍රි.ව. 1375 - 1391)
    - තිසර සන්දේශය (ක්‍රි.ව. 1409 - 1415)

- කෝට්ටේ යුගය
  පරෙවි සන්දේශය (ක්‍රි.ව. 1430 - 1440)
  කෝකිල සන්දේශය (ක්‍රි.ව. 1440 - 1446)
  සැළලිහිණි සන්දේශය (ක්‍රි.ව. 1450)
  ගිරා සන්දේශය (ක්‍රි.ව. 1457 - 1465)
  හංස සන්දේශය (ක්‍රි.ව. 1457 - 1465)

- මහනුවර යුගය
  i. කහකුරුලු සන්දේශය (ක්‍රි.ව. 1710 - 1739)
  ii. කැටකිරිලි සන්දේශය (ක්‍රි.ව. 1788)
  iii. නීලකොබෝ සන්දේශය (ක්‍රි.ව. 1780)
  iv. දිය සැවුල් සන්දේශය (ක්‍රි.ව. 1813)
  v. කිරල සන්දේශය (ක්‍රි.ව. 1815)

සන්දේශ කාව්‍ය ආකෘතිය

ප්‍රසිද්ධ පුද්ගලයෙකු කථානායකයා වීම.
ඉතිහාස කථාවකින් හෝ ආශිර්වාදයකින් ඇරඹීම
දූතයා ලෙස ප්‍රසිද්ධ උතුම් පුද්ගලයෙකු යොදා ගැනීම.
සුවදුක් විමසමින් දූතයා වර්ණනා කිරීම.
දූතයාට යායුතු ස්ථානය පැවසීම.
අතරමග හමුවන ප්‍රභූන් හා ස්ථාන වර්ණනා කරමින් මාර්ගය දැක්වීම.
සන්දේශ ග්‍රාහකයා උසස් ලෙස වර්ණනා කිරීම.
සන්දේශය කියවීම.
දූතයාට ස්තුති කිරීම හා සෙත් පැතීම.

කෝට්ටේ යුගයේ සන්දේශ සාහිත්‍යය

පරෙවි සන්දේශය

- කර්තෘ - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
- අරමුණ - චන්ද්‍රවතී කුමරියට සැමියෙකු හා පුතෙකු ප්‍රාර්ථනා කිරීම
  - පැරකුම් රජුට උපුල්වන් දෙවියන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කිරීම.
- ගමන් මග - ශ්‍රී ජයවර්ධනපුරය - දෙව්නුවර උපුල්වන් දෙවොල
- පද්‍ය - 203

කෝකිල සන්දේශය

- කර්තෘ - දෙව්නුවර තිලක පිරුවන්පති හිමි.
- අරමුණ - යාපාපටුන සපුමල් කුමරුට ස්ථිර කර දෙන ලෙස උපුල්වන් දෙවියන් යැදී බව ඔහුට දැන්වීම සඳහා
- ගමන් මග - දෙව්නුවර - යාපාපටුන
- පද්‍ය - 291

සැළලිහිණි සන්දේශය

- කර්තෘ - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
- අරමුණ - උලකුඩය දේවියට පුතෙකු ලබා දෙන මෙන් විභීෂණ දෙවියන් යැදීම.
- ගමන් මග - කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරය - කැලණිය
- පද්‍ය - 108

ගිරා සන්දේශය

- කර්තෘ - අඥාතයි (තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් නායකත්වය දුන් ග්‍රාමවාසී ගුරු කුලයට අයත් රාහුල හිමියන්ගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් ගිරා සන්දේශය රචනා කරන්නට ඇතැයි අනුමාන කෙරේ.)
- අරමුණ - පැරකුම් රජු වැනීම හා දේවාසිරි පැතීමත් ශ්‍රී රාහුල හිමියන් වර්ණනා කිරීමත් ය.
- ගමන් මග - ශ්‍රී ජයවර්ධනපුරය - තොටගමු විජයබා පිරිවෙණ
- පද්‍ය - 254

හංස සන්දේශය

- කර්තෘ - වීදාගම මහා මෛත්‍රෙය හිමි
- අරමුණ - පැරකුම් රජුට සෙත් පැතීම
- ගමන් මග - ශ්‍රී ජයවර්ධනපුරය - කැරගල පද්මාවතී පිරිවෙණ
- පද්‍ය - 200

## ගිරා සන්දේශය

ගිරා සන්දේශයේ වර්ණනා

- දූත වර්ණනාව
- ජයවර්ධනපුර වැනුම
- පැරකුම්බා රජ වැනුම
- පැපිලියාන විහාර වැනුම
- දියකෙළි වැනුම
- සැඳෑ වැනුම
- අම්බලමේ කතා
- වන වැනුම
- තොටගමු වෙහෙර වැනුම
- විජයබා පිරිවෙණ වැනුම
- සිරි රහල් හිමි වැනුම

ගිරා සන්දේශයේ වර්ණනාවල විශේෂ ලක්ෂණ

- ගිරා සන්දේශයේ ස්වාභාව සෞන්දර්ය වැනුම්වල දී ස්වාභාවික සුන්දරත්වය ඉස්මතුවන අයුරින් ඉදිරිපත් කර තිබීම.
- ගිරා සන්දේශයේ බෞද්ධ ස්වරූපය විමසීම
- වර්ණනාවලට උචිත විරිත් බහුල ව භාවිත කොට තිබීම.
    - සමුද්‍රඝෝෂ විරිත භාවිතකොට ඇත.
    - දියකෙළි, වන, අම්බලමේ කතා ආදී වැනුම්වල දී විරිත වෙනස් වේ.
    - අර්ථ රසය හා ශබ්ද රසය මතු කෙරෙන වර්ණනා විමසීම

- උපමා, රූපකාදී කාව්‍යෝපක්‍රම භාවිතය හා ගිරා සන්දේශ කවියාගේ බස්වහර කෙරෙහි අවධානය යොමු කිරීම
- දූතයාට ගමන් මගෙහි දී හමුවන සුවිශේෂ ස්ථාන හා පුද්ගලයින් ඇසුරින් සමකාලීන - සමාජ තොරතුරු විමසීම
- ගිරා සන්දේශ කවියාගේ වර්ණනා චාතුර්යය විග්‍රහ කිරීම
    - සාම්ප්‍රදායික ඇදහිලි, විශ්වාස, සුබනැකැත් ආදිය ගැන කවියාගේ ආකල්ප හඳුනාගැනීම

**ඇගයීම**

සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත සඳහන් මාතෘකා අනුව තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න.

සන්දේශ කාව්‍ය පිළිබඳ ඓතිහාසික තොරතුරු සිංහල සාහිත්‍යයේ ආරම්භය හා විකාශය යුග අනුව

- කෝට්ටේ යුගයේ සාහිත්‍යය

  ගිරා සන්දේශය
  කාලය
  යුගය
  අරමුණ
  පණිවිඩය ආදි තොරතුරු

කණ්ඩායම් මගින් ඉදිරිපත් කළ කරුණු ගොනු කරමින් 'කෝට්ටේ' සන්දේශ කාව්‍ය ඉතිහාසය යන මැයෙන් ලිපියක් ලියන්න.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට පහත සඳහන් මාතෘකා ලබා දෙන්න.

මයුර සන්දේශය
තිසර සන්දේශය
පරෙවි සන්දේශය
කෝකිල සන්දේශය
සැළලිහිණි සන්දේශය
හංස සන්දේශය

**පියවර 2**

එක් එක් සන්දේශයේ ලක්ෂණ පිළිබඳ ගවේෂණයට සිසු කණ්ඩායම්වලට අවස්ථාව සලසා දෙන්න.

යුගය හා කතුවරයා
ලිවීමේ අරමුණ
සන්දේශ හාරකයා
කවි සංඛ්‍යාව
ආදි තොරතුරු පුස්තකාල පරිහරණය මගින් සොයා ගැනීමට ඉඩ සලසන්න.

**පියවර 3**

සොයාගත් කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට එක් එක් සිසු කණ්ඩායම්වලට අවස්ථාව සලසන්න.

**පියවර 4**

සිසුන් ඉදිරිපත් කළ කරුණු ද සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක් කරන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1**

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

ගිරා සන්දේශයේ ආරම්භයේ සිට එන වර්ණනා සිසුන් සමග සාකච්ඡා කර වෙන් වෙන්ව හඳුනාගන්න.

සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර එක් වර්ණනාවක් බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න

**පියවර 2**

එම වරණනාවේ ඇති දුරවබෝධ වචන ලැයිස්තු ගත කිරීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න. ශබ්දකෝෂ පරිහරණය මගින් එම දුරවබෝධ වචන සඳහා අරුත් සපයා ගැනීමට සිසු කණ්ඩායම්වලට මඟ පෙන්වන්න.

**පියවර 3**

අරුත් පැහැදිලි කිරීම සඳහා සිසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 4**

සිසු ඉදිරිපත් කිරීම් ද අගය කරමින් සමාලෝචනයක නිරතවන්න.

සිසුන් සොයාගත් දුරවබෝධ වචන හා අරුත් පැහැදිලි කිරීම් පන්තියේ ප්‍රදර්ශනය සඳහා සුදුසු පරිදි සකස් කිරීමට උපදෙස් දෙන්න.

සෙසු වර්ණනා සඳහා ද මෙම ක්‍රමය යොදා ගත හැකි ය.

**ක්‍රියාකාරකම 3**

**පියවර 1**

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

ගිරා සන්දේශයේ තෝරාගත් කවි එක් එක් කණ්ඩායම වෙත ලබා දෙන්න.

**පියවර 2**

එක් එක් කණ්ඩායම වෙත ලබා දුන් කවි රසාස්වාදය කිරීම සඳහා අවස්ථාව සලසන්න.

එහිදී, එම කවිවල

අරුත්
බස්වහර
කාව්‍යාලංකාර
විරිත
ආදි ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරවන්න.

**පියවර 3**

රසාස්වාද ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම්වලට අවස්ථාව සලසන්න.

**පියවර 4**

සිසු ඉදිරිපත් කිරීම් ද සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

ඇගයීම

සන්දේශ කාව්‍යයක දක්නට ලැබෙන පොදු ලක්ෂණ දක්වන්න.

නියමිත කොටස ඇසුරෙන් ගිරා සන්දේශයේ විශේෂතා පැහැදිලි කරන්න.

**පරිශීලනීය ග්‍රන්ථ**

| | | |
|---|---|---|
| සිංහල සාහිත්‍යයේ නැගීම | - | මාර්ටින් වික්‍රමසිංහ |
| සිංහල සාහිත්‍ය වංශය | - | පුංචි බණ්ඩාර සන්නස්ගල |
| සිංහල සන්දේශ සාහිත්‍යය | - | පුංචි බණ්ඩාර සන්නස්ගල |
| කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය | - | කේ.ඩී.පී. වික්‍රමසිංහ |
| සිංහල සාහිත්‍ය ලතා | - | කොත්මලේ අමරවංශ හිමි |
| සාහිත්‍ය විවේචන | - | අශෝක කරුණාරත්න |
| සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය | - | ඒ.වී. සුරවීර |
| සාහිත්‍ය විද්‍යාව | - | එදිරිවීර සරච්චන්ද්‍ර |
| කල්පනා ලෝකය | - | එදිරිවීර සරච්චන්ද්‍ර |
| කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය | - | බන්දුසේන ගුණසේකර |
| විචාර විලාසය | - | ඒ.වී. සුරවීර |

**කෙටිකතා**

| | | |
|---|---|---|
| **නිපුණතාව 5.0** | **:** | සිංහල කෙටිකතා මාධ්‍ය හා එහි ලක්ෂණ ගවේෂණය කරමින් කෙටිකතා සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක යෙදෙයි |
| **නිපුණතා මට්ටම** | **:** | 5.1 සිංහල කෙටිකතා කලාව පිළිබඳ ව විචාරවත් බවක් ප්‍රදර්ශනය කරයි<br>5.2 නිර්දිෂ්ට කෙටිකතා විචාරය කරයි<br>5.3 කෙටිකතා කියවීමෙන් ලබා ගත් දැනුම නිර්මාණාත්මක ලේඛනය සඳහා යොදා ගනියි |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | **:** | 40 යි. |

**ඉගෙනුම් ඵල**

- කෙටිකතාව යනු කුමක් දැයි නිර්වචනය කරයි.
- කෙටිකතාවක මූලික ලක්ෂණ විස්තර කරයි.
- විවිධ කෙටිකතා සම්ප්‍රදායන් හඳුනාගෙන පැහැදිලි කරයි.
- කෙටිකතා විචාර මූලධර්ම කිහිපයක් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෙටිකතා කියවයි.
- නිර්දිෂ්ට කෙටිකතා පිළිබඳ රසාස්වාදයක් ලියයි.
- කෙටිකතා කිහිපයක් නිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

- කෙටිකතා කලාවේ ලක්ෂණ
    - අත්දැකීම් වර්ග
        - ස්වකීය අත්දැකීම්
        - අන් අයගේ අත්දැකීම්
        - කාල්පනික අත්දැකීම්
    - කෙටිකතා සන්දර්භය
        - ආරම්භය
        - විකාශය
        - තීරණාත්මක අන්තය
    - කෙටිකතාවක දෘෂ්ටි කෝණය
        - උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය
        - ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණය
        - සර්වවේදී දෘෂ්ටි කෝණය
    - චරිත නිරූපණය
        - සරල චරිත
        - සංකීර්ණ චරිත
        - පැතලි චරිත
        - වටකුරු චරිත
        - පසුබිම් චරිත

අනෙකුත් අංග ලක්ෂණ
කතා වින්‍යාසය
පසුබිම් වර්ණනා
සංකේත
ජීවන දෘෂ්ටිය
භාෂාව භාවිතය

**සිංහල කෙටිකතා කරුවන් කිහිප දෙනෙක්**

ඩබ්ලිව්.ඒ. සිල්වා
මාර්ටින් වික්‍රමසිංහ
ජී.බී. සේනානායක
ගුණදාස අමරසේකර
කේ. ජයතිලක
මඩවල එස්. රත්නායක
අජිත් තිලකසේන
සයිමන් නවගත්තේගම
ඇරුව්වල නන්දිමිත්‍ර
සෝමරත්න බාලසූරිය
ඒ.වී. සුරවීර
මිනිවන් පී. තිලකරත්න
පියසීලී විජේමාන්න
දයාසේන ගුණසිංහ
ජයතිලක කම්මැල්ලවීර
රංජන් ධර්මකීර්ති

**ක්‍රියාකාරකම** 1 - කෙටිකතාව යනු කුමක් දැයි නිර්වචනය කිරීම.

**පියවර** 1

ඔබ කියවූ කෙටිකතා ඇසුරින් කෙටිකතාවක් යනු කුමක් දැයි තමාගේ ම නිර්වචනයක් කුඩා කාඩ්පත්වල ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.

එම කාඩ්පත් ප්‍රදර්ශනය කරන්න.

**පියවර** 2

එම කාඩ්පත් ඇසුරෙන් සිසු නිර්වචන පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර** 3

කෙටිකතාව පිළිබඳ ප්‍රසිද්ධ ලේඛකයන්ගේ නිර්වචන කිහිපයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

එකී ලක්ෂණ නිර්දිෂ්ට කෙටිකතාවේ තිබේදැයි නැවත සාකච්ඡා කර නිර්වචන තහවුරු කරන්න.

නිර්වචන සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 2** - කෙටිකතාවක් විචාරය කරමු.

**පියවර 1**

කෙටිකතාවක මූලික ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 2**

පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න.
පහත සඳහන් තේමා ඔස්සේ කරුණු ගවේෂණයක යොදවන්න.
කෙටිකතාවක සන්දර්භය
කෙටිකතාවක භාෂාව
කෙටිකතාවක පරිසර වර්ණනා හා සංකේත
කෙටිකතාවක චරිත නිරූපණය
සිසුන් සොයාගත් කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස උපදෙස් දෙන්න.

**පියවර 3**

ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
කෙටිකතා විචාර මූලධර්මවලට අනුව ශිෂ්‍ය අදහස් සමාලෝචනය කරන්න.
සමාලෝචනයේ දී එකතු වූ කරුණු ද යොදා ගනිමින් අත් පත්‍රිකාවක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 3**

**පියවර 1**

සහ කියවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් කෙටිකතාවක් පන්තියේ දී කියවන්න

**පියවර 2**

දම්වැල් ක්‍රමවේදය අනුගමනය කරමින් කියවන ලද කතාවේ කතා සාරය ගොඩ නගන්න.
වැදගත් සිද්ධි හා අවස්ථා ගිළිහේදැයි ගුරුවරයා සැලකිලිමත් වන්න.

**පියවර 3**

කෙටිකතා රසාස්වාදය කිරීමේ දී පහත සඳහන් තේමා ඔස්සේ රසාස්වාදයේ යෙදිය හැක.

ජීවන දෘෂ්ටිය
අනුභූතිය
චරිත හා චරිත ලක්ෂණ
අවස්ථා හා සිද්ධි නිරූපණය
සංකේත
භාෂාව
දෘෂ්ටිකෝණය

## කෙටිකතා

### පුරුද්ද

| | |
|---|---|
| අත්දැකීම | ඃ ගම්බද වෙදකම හා වෙදෙකුගේ චරිතයේ අවස්ථා නිරූපණය අත්දැකීමක් ලෙසින් |
| දෘෂ්ටි කෝණය | ඃ ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් රචනා වී ඇත. |
| කතා වින්‍යාසය | ඃ හේතුඵල සම්බන්ධතාව මත කතාව විකාශනය වේ. දෙබස්, සංවාද ආශ්‍රිත ව ආඛ්‍යාන ශෛලියෙන් නිර්මිත ය. |
| චරිත නිරූපණය | ඃ ප්‍රධාන චරිතය වලෙන්ති නමින් නිරූපණය වේ. ගම්බද වෙද මහතෙකුගේ වෛද්‍ය සේවයේ ආදර්ශවත් අවස්ථා මෙකී චරිතයෙන් විෂද කෙරේ. වෙනත් වෙදමහතුන්ගේ සෙවයේ දී දක්නට නොලැබෙන සිද්ධීන් වටා කතාව විකාශය කෙරේ. නිරූපිත ඇතැම් අවස්ථාවලින් වෙනත් වෙදවරුන් නොකරන විස්මය දනවන සුලු සේවාදායකත්වයක් වලෙන්ති වෙද චරිතයෙන් ඉස්මතුවේ. |
| අවස්ථා හා සිද්ධි නිරූපණ | ඃ කෙටිකතාකරුවාගේ අපේක්ෂිත අරමුණ වන්නේ වලෙන්ති වෙද චරිතයෙන් විස්මිත චරිතාංග මතු කිරීමත් එම චරිතයේ ම පහත් ගති ලක්ෂණ පිළිබිඹු කිරීමට උත්සාහ කිරීමත් ය. ජන්මෙට වඩා පුරුද්ද ලොකුය යන  උපහැරණය මෙම කතාවේ සිද්ධි ඇසුරින් ප්‍රකාශ වේ. ලෙඩෙකු සුවකිරීම සඳහා ප්‍රායෝගික ව විවිධ ක්‍රියාකාරකම් මගින් වලෙන්ති වෙදැදුරා උත්සාහ ගනියි. හෙතෙම සිය වෘත්තියට නිගා කරවන අවැඩ ක්‍රියාවක් සිදුකළ බව කතාව අවසානයේ එන කතුරක් සොරකම් කිරීමේ සිද්ධියෙන් අනාවරණය වේ ආදර්ශවත් චරිතයක පවා ඇතැම්විට ගුඪ ලක්ෂණ පවතින බව මේ කතාවෙන් ගම්‍ය වේ. |
| පසුබිම් වර්ණනා | ඃ වෙදමහතාගේ වෙදකමේ ස්වභාවය හා ඒ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රකාශවන අයුරින් සිද්ධි කථනය වාර්තා ස්වරූපයෙන් ලියැවී ඇත. වෙසෙස් වැනුම් දැකිය නොහැකි ය. |
| ජීවන දෘෂ්ටිය | ඃ වෙනත් වෙදැදුරන්ගෙන් පිළිබිඹු නොවන වෙසෙස්වූ පරාර්ථකාමී වෙද සේවයක් මගින් සමාජ සේවයට කැපවුණු දායකත්වයක් වෙදැදුරාගේ චරිතයෙන් පිළිබිඹු කෙරේ. |
| භාෂාව | ඃ සරල, ග්‍රාමීය වදන් බහුල භාෂා රටාවක් යොදා ගෙන ඇත. |

**තමන්ගේ දරුවෝ**

අත්දැකීම : නිදසුනක් ලෙස ධනපති පාන්තික පවුලක ගෘහපතිනියකගේ ඥාති දියණියක කෙරෙහි දක්වනු ලබන අකාරුණික බව පෙන්නුම් කිරීමක් අත්දැකීම බවට පත් කරගෙන ඇත.

දෘෂ්ටිකෝණය : ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණයෙන් රචනා වී ඇත.

කතා වින්‍යාසය : පවුල් සංස්ථාව තුළ සිද්ධි ක්‍රමිකව නිරූපණය වන පරිදි කතාව විකාසය වේ. 'ලොකු හාමිනේ' නම් ධනපති පාන්තික බිරිඳක සිය ඥාති දියණියක වන ගුණවතී කෙරෙහි දක්වන අකාරුණිකත්වය වටා සිද්ධි, දෙබස් විවරණ කරමින් කතා වින්‍යාසය ගොඩනංවයි.

චරිත නිරූපණය : අකාරුණිකත්වය, දරුවන්ගේ දුක හමුවේ නොසැලෙන දැඩි ස්වභාවය ලොකු හාමිනේගේ චරිතයෙන් නිරූපිත ය. අසරණයන්ට පිහිටවන සුලු ආරච්චි මහතාගේ චරිතයෙන් දයාව විද්‍යමාන වේ.

අවස්ථා හා සිද්ධි නිරූපණ : ජිනදාස නම් අසනීප වූ පුතෙකුට අසීමිත සෙනෙහස දක්වන ලොකු හාමිනේ සිය නිවසෙහි වෙසෙන ගුණවතී නම් අසනීප වූ සිය ඥාති දියණිය වෙත අඩු උපස්ථාන හා අමානුෂික ලෙස සැලකීමෙන් ගුණවතීගේ රෝගී තත්වය වැඩිවීම නිසා වෙදෙකුගෙන් ප්‍රතිකාර ගැනීමට සිය මාමා වන ආරච්චි මහතා විසින් උත්සාහ කිරීමත් කතාවේ අවස්ථා යටතේ විවරණය කෙරේ.

භාෂාව : සරල බස් වහරක් උපයෝගී කරගෙන ඇත. කතා ව්‍යවහාරයේ එන වදන්, සංවාද සඳහා යොදා ගෙන ඇත.

**සත්ගුණවත් සාමෙල්**

| | |
|---|---|
| තේමාව | ඃ නිදසුන් ලෙස සාමෙල් මියයාම හා බැඳුණු සිදුවීම් වස්තු විෂය කරගනියි. |
| දෘෂ්ටි කෝණය | ඃ උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය යොදා ගනියි. |
| කතා වින්‍යාසය | ඃ සිද්ධි අනුපිළිවෙළින් දක්වයි. දෙබස්, සිද්ධි ඇසුරු කරගෙන කතා පුවත විවරණය කරයි. හේතුඵල සම්බන්ධතාව කෙරෙහි විශේෂාවධානය යොමු කරමින් කතා වින්‍යාසය ගොඩ නගයි. |
| චරිත නිරූපණය | ඃ මෙහි එන සාමෙල් සංකීර්ණ ගති ලක්ෂණ සහිත ව නිරූපිත ය. කථකයා සහ ලයනල් රාලහාමි මෙන් ම සොපිහාමි යන චරිත සාමෙල්ගේ චරිතය නිරූපණය කිරීමට යොදා ගනියි. සාමෙල්ගේ චරිතය තුළ අභ්‍යන්තර මෙන් ම බාහිර ගති ලක්ෂණ ද හඳුනා ගත හැකි අතර බාහිර චරිත ලක්ෂණ අතර සාධනීය ගති ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. අභ්‍යන්තර ගති ලක්ෂණ අතර නිෂේධනීය ගති ලක්ෂණ ද හඳුනාගත හැකි ය.<br>ලයනල් රාලහාමි ගැමි ධනපතියෙකු ලෙස නිරූපණය කර ඇත. කෙටිකතාව තුළ නිරූපිත අප්‍රධාන චරිත, ප්‍රධාන චරිතය නිරූපණය සඳහා පදනම් කර ගෙන ඇත. |
| පසුබිම් වර්ණනා | ඃ ගැමි සමාජයෙහි ජීවත් වූ දරිද්‍රතාවෙන් පෙළුණු පුද්ගලයෙකුගේ සිතුම් පැතුම් ද එම සමාජයේ පුද්ගලයන්ගේ එදිනෙදා ජීවිතය, ඔවුන්ගේ හැසිරීම් පිළිබඳ අවබෝධයක් ඇතිවන අයුරින් පසුබිම් වර්ණනා ද යොදාගෙන ඇති ආකාරය විමර්ශනය කළ හැකි ය. |
| අවස්ථා හා සිද්ධි නිරූපණය | ඃ සාමෙල්ගේ මරණය හා සම්බන්ධ සිදුවීම් ද සාමෙල් පිළිබඳ හෙළිකරන සංවාදමය අවස්ථා යොදාගෙන ආඛ්‍යාන ශෛලියෙන් අවස්ථා හා සිද්ධි නිරූපණ කරයි. |
| භාෂා භාවිතය | ඃ පාඨක මනසෙහි චිත්ත රූප මැවෙන අයුරින් ලේඛකයා බස යොදා ගනියි. චරිත නිරූපණයට උචිත භාෂා රටාවක් භාවිත කරයි. සොපිහාමිගේ සහ ලයනල් රාලහාමිගේ මුවට නංවන වදන් ඊට නිදසුන් ය. එක් එක් චරිත සඳහා ඊට ආවේණික භාෂා රටාවක් යොදා ගනියි. |
| ජීවන දෘෂ්ටිය | ඃ ජීවත්වීම සඳහා අනවරත අරගලයක යෙදෙන ගැමියන් දෙස සානුකම්පිතව බැලීමට කතුවරයා උත්සුක වේ. |

**තාත්තා**

| | |
|---|---|
| අත්දැකීම | ඃ අසීමිත පිය සෙනෙහස සිත තුළ සිර කරගෙන සමාජ ජීවිතයට අවතීර්ණ වූ පුත්‍රයකු මුහුණ දෙන ගැටුම්කාරී තත්වයන් හා ඒ හා බැඳුණු සිදුවීම් පාදක කර ගනිමින් රචිත කෙටිකතාවකි. |
| දෘෂ්ටි කෝණය | ඃ උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයෙන් කතාව රචනා වී ඇත. |
| කතා වින්‍යාසය | ඃ සංවාද දෙබස් ආදියෙන් පෝෂණය ලබමින් අඛ්‍යාන ශෛලියෙන් ගොඩනැගුණු කතාවකි. |
| චරිත නිරූපණය | ඃ මෙහි එන තාත්තා ගැමි පුරුෂාර්ථයන් හිසින් ගත් දරු සෙනෙහසින් හදවත හිස් නොකළ නිහඬ නොසැලෙන චරිතයකි. බලෙන් හික්මවා ගත් ආත්ම සංයමයකින් යුතු වුව ද වහා කිපෙන සුලු දැඩි සිතක් පුතාගේ චරිතය තුළ ඇත. |
| අවස්ථා හා සිද්ධි නිරූපණය | ඃ පුතාගේ පවුල් ජීවිතයට අදාළ ඇතැම් ගැටුම්කාරී අවස්ථාවන් මෙම කෙටිකතාව තුළ ඉතා උද්වේගකාරී ලෙස නිරූපණය කෙරේ. මෙහි එන ඇතැම් ප්‍රකෝපකාරී හැසිරීම් එවන් පුත්‍රයෙකුගෙන් අපේක්ෂා කළ නොහැකි තරම් සාහසික ය. සිය එක ම දරුවා කෙරෙහි උපන් නොසැලෙන දාරක ප්‍රේමය මේ කෙටිකතාව පුරා ම ගලායන්නේ තාත්තා හා සම්බන්ධ සිදුවීම් මාලාව සමග ය. |
| නිර්මාණ හා භාෂා | ඃ ජී.බී. සේනානායකයන්ට ම අනන්‍ය වූ කෙටි වැකි සහිත අපූරු භාෂා රටා භාවිතය මෙහිදී නොඅඩුව දක්නට ලැබේ. ලේඛන වහර බහුල ව යොදා ගත්ත ද ඉන් පාඨකයා වෙහෙසන සුලු බවක් නො හැඟෙයි. |
| ජීවන දෘෂ්ටිය | ඃ අප්‍රකාශිත ව පැවතිය ද පිය සෙනෙහස දරුවෙකුගේ හදවත ගැඹුරින් ම ස්පර්ශ කරන බව මින් ප්‍රකාශිත ය. එවැනි බැඳීමක් බිඳී යාමෙන් හට ගන්නා කම්පනය යළි ගොඩ නැගිය නොහැකි සේ දෙදරුම් කෑ හැකිය යන්න මෙහි දී ධ්වනිත වෙයි. |

**මුදියන්සේ මාමා**

අත්දැකීම : විවාහාපේක්ෂිත වයස ඉක්මවා යමින් සිටින දියණියක හා විවාහාපේක්ෂිත දියණියක කුඩා පුත්‍රයෙකු ද සමග කුටුම්බය තුළ තනි වූ වැන්දඹුවක වටා මෙම කෙටිකතාව ගොඩනැගී ඇත. සිය මල්ලී වන මුදියන්සේ මාමාගේ ආටෝප සාටෝප සහිත නාගරික ජීවිතයේ සෙවණැල්ල ඍජුව ම මෙම කුටුම්බය වෙත පතිත ව ඇත. ඔවුන් යම් මුළාවකට හසුවන්නේ ද එකී සෙවණැල්ල නිසා ම ය.

දෘෂ්ටි කෝණය : ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් කෙටිකතාව රචනා වී ඇත.

කතා වින්‍යාසය : සංවාද දෙබස් පරිසර වර්ණනා ආදිය මගින් අවස්ථා හා සිද්ධි අතර මනා පෙළගැස්මක් සහිත ව කතා වින්‍යාසය ගොඩ නැගී ඇත. මෙහි සන්දර්භය පරිසමාප්තිය අතින් පමණක් නොව රස ජනනය අතින් ද පොහොසත් ය.

චරිත නිරූපණය : මෙහි එන වැන්දඹු ස්ත්‍රියක වන කළුතර හාමිනේ සිය මලණුවන් නිසා උපන් ගර්වයකින් හිස උදුම්මාගත් චරිතයකි. සඟවාලිය නොහැකි පරිද්දෙන් ඉස්මතු වන අසරණ බව කළුතර හාමිනේගේ චරිතය පුරා ම දක්නට ලැබේ. මුදියන්සේ මාමා සමාජයේ ඉහළ ස්තරයකට නැඟීමේ නොතිත් ආශාවෙන් මඩනා ලද සිත් ඇති චරිතයකි. මනුෂ්‍ය සමාජය පුරා ම විසිරී ඇති කළකිරීම්, වේදනා, වින්දන ආදී සියල්ල දෙස අනුකම්පාව මුසු බැල්මක් හෙළන්නට දැරූ උත්සාහයක් මේ කෙටිකතාවෙන් හෙළිවේ.

අවස්ථා හා සිද්ධි නිරූපණය : ගුණසීල මුදියන්සේ කළුතර හාමිනේගේ ගෙදර මිදුලට සම්ප්‍රාප්ත වන අවස්ථාව රමණීය වාක් චිත්‍රයක් වැන්න. අනතුරුව දිවා ආහාර අවස්ථාවෙහි මතුවන පියදාසගේ හැඳි ගැරුප්පු හරඹය ද විචිත්‍රවත් ය. මුදියන්සේ මාමාගේ ගෙදර දී මාලිනීගේ ඇසින් විස්තර වන සිද්ධි හා අවස්ථා විවරණ නාගරික ජීවිතයේ සාඩම්බර, ආටෝප සහිත බව මනාව නිරූපණය කරන්නට සමත් ය.

පරිසර වර්ණනා : මෙහි එන පරිසර වර්ණනා, කතා රසය තීව්‍ර කිරීමට නිරන්තර ව හේතු පාදක වෙයි. ගඟට පසුබිම් වූ කළුතර හාමිනේගේ නිවස කතුවරයා විස්තර කරනුයේ ශූර චිත්‍ර ශිල්පියෙකු මෙනි. පුස් බැඳුණු තෙත් වූ ගෙයි බිත්ති ආදිය පවා ඒ ගෙයි වසන්නවුන්ගේ ඇතුළාන්තය මොනවට විදහාපායි.

ජීවන දෘෂ්ටිය : සමාජ යථාර්ථය ගැඹුරින් අවලෝකනය කිරීමෙහි ලා කතුවයා සතු හැකියාව මින් ප්‍රකට වෙයි. මිනිස් සමාජයේ ජනිත වන වේදනා වින්දන දුක් සුසුම් හා බැඳුණු ඇවතුම් පැවතුම් මින් මැනවින් ප්‍රතිනිර්මාණය වෙයි.

**සාක්කි තුනක්**

| | |
|---|---|
| අත්දැකීම | ඃ මිනීමැරුම් හා බැඳුණු අත්දැකීම් විෂය කොට ගෙන බැඳුණු කතාවකි. |
| දෘෂ්ටි කෝණය | ඃ බහු ආත්ම භාෂණ දෘෂ්ටි කෝණයෙන් රචනා වී ඇත. |
| කතා වින්‍යාසය | ඃ සාක්ෂ්‍ය සටහන් මාර්ගයෙන් කතා සන්දර්භය විෂද කොට දක්වයි. ජපන් කෙටිකතාකරුවෙකු වන අකුතගාවාගේ 'වන ලැහැබකදී' නම් කෙටි කතාවෙන් පැහැදිලි ආලෝකයක් ලබා ඇත. වෙනත් කෙටිකතාවලට වඩා කතා ශෛලියෙන් හා ආකෘතියෙන් වෙනස් ය. නඩුවකට සම්බන්ධ සාක්ෂ්‍ය 03 ක් ඇතුළත් සිද්ධි කථනයක් වාර්තා ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇත. |
| චරිත නිරූපණය | ඃ කථකයා හා ඔහුගේ සොහොයුරා සහ සොහොයුරාගේ මිතුරෙකු වන පොලිස් භටයෙකු වශයෙන් චරිත තුනක් මේ කතාවේ දැකිය හැකි ය. |
| අවස්ථා හා සිද්ධි නිරූපණය | ඃ කතාව මුල් කොටසේ පොලිස් නිලධාරියෙකු කථකයාගේ සොහොයුරා හමුවට ගණිතය ඉගෙනුමට පැමිණීමත් සිය සොහොයුරා මගින් හෙතෙම කථකයාට හඳුන්වාදීමත් සිදුවේ. පසුව පොලිස් නිලධාරියා විසින් කථකයාට කියවීම සඳහා පරණ ලිපිගොනුවක වූ නඩුවක් සම්බන්ධ සාක්ෂ්‍ය සටහන් 03 ක තොරතුරු ලබාදෙයි. මෙය කතාවේ දෙවන කොටසක් සේ විද්‍යමාන වේ.<br>වලව්වක පනස් පස් වයසැති හාමු කෙනෙකුත් සිය එක ම පුතු වන සුජීවත් සිය නිවසට පසුකාලීනව සේවයට පැමිණි පොඩිනා හා ඇගේ සුරූපී දියණිය වන සුදනීත් පිළිබඳ තතු ඉදිරිපත් කෙරේ. වලව්වේ සිදු වූ පොඩිනාගේ මරණය පිළබඳ සාක්කි 03ක් ඔස්සේ සිද්ධි කථනයක් වාර්තා ස්වරූපයෙන් ඉදිරිපත් කෙරේ. |
| සංකේත භාවිතය | ඃ වීරසේකර මුදලි හා සුජීව වීරසේකර විසින් ධනේශ්වර පන්තිය සංකේතවත් කෙරේ. |
| ජීවන දෘෂ්ටිය | ඃ ධනපති පාන්තික සමාජය තුළ ද අමානුෂික හා අශීලාචාරකම් සුලබ ව දැකිය හැකි බවත්, එයින් දිළිඳු පන්තිය පීඩාවට පත්වන බවත් කතාව තුළින් ජනිත වන ජීවන දෘෂ්ටියක් සේ දැක්විය හැකි ය. |

**පුතාගේ ශිෂ්‍යත්වය**

| | |
|---|---|
| අත්දැකීම | ඃ ස්වකීය පුත්‍රයාට විදේශීය රටක ශිෂ්‍යත්වයක් ලබාදීමට උත්සාහ ගන්නා ගුණතිලක නමැති පියාගේ චරිතය මුහුණදෙන ගැටුම්කාරී තත්වයන් හා ඒ හා බැඳුණු සිදුවීම් පාදක කරගෙන 'බටහිර රටවල දේශපාලන බලවේග අප රටෙහි ජාතික චින්තනය වැනසීමට කුමන්ත්‍රණය කරති' යි යන දේශපාලන පදනම කතුවරයා තේමා කර ගනියි. |
| දෘෂ්ටි කෝණය | ඃ ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණය භාවිත කර කෙටිකතාව රචනා කර ඇත. |
| කතා වින්‍යාසය | ඃ චරිත සහ සිදුවීම් අතර සබඳතාව පවත්වා ගනිමින් අතීතාවර්ජන ද භාවිත කරමින් ආඛ්‍යාන ශෛලියෙන් කතාව ගොඩනගා තිබේ. |
| චරිත නිරූපණය | ඃ තරුණ අවදියේ දී සමාජවාදී අදහස් දැරූ දේශපාලන ප්‍රවාහයට එක් ව සිට සිය පුතු වූ සුනන්ද අත්අඩංගුවට ගැනීමෙන් පසු මුහුණ පෑ කටුක අත්දැකීම් හේතුවෙන් එම දේශපාලන අදහස් ඉවත දැමූවෙකුගේ චරිතයක් ලෙස ගුණතිලකගේ චරිතය නිරූපිත ය. ගුණතිලක සමකාලීන දේශපාලනය පිළිබඳ ඇල්මැරුණු උදාසීන ප්‍රතිචාර දක්වන්නෙකි. ස්වකීය පුත්‍රයාගේ සිතුම් පැතුම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් නොමැති චරිතයකි. ගෘහස්ථ ජීවිතය තුළ දී සිය බිරිඳ සහ පුතු සමග සබඳතාවේ දී රළු ගති ලක්ෂණ පළ කරයි. එහෙත් පුතු කෙරෙහි දැඩි සෙනෙහසක් ඇත්තෙකි.<br><br>ස්වකීය ජීවිතාපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමට නොපසුබට උත්සාහයක් දරන තැනැත්තෙකු ලෙස සිරිනාථ දෙණිපිටියගේ චරිතය නිරූපිත ය. දේශීය චින්තනයෙන් බැහැර වූ බටහිර සිතුම් පැතුම් කරපින්නාගත් චරිතයකි. කෙටිකතාවෙහි නිරූපිත අප්‍රධාන චරිත ප්‍රධාන චරිත නිරූපණය සඳහා පදනම් කර ගනියි. |
| පසුබිම් වර්ණනා | ඃ ගුණතිලකගේ සිතුම් පැතුම් නිරූපණය කිරීම සඳහා සිරිනාථ කොටුවට ගොස් දෙණිපිටිය සොයා යන ගමන පාදක කර ගනියි. |
| අවස්ථා හා සිද්ධි නිරූපණය | ඃ ගුණතිලක කොළඹට යන ගමන සහ ඔහු අතීතය ආවර්ජනය කිරීම මගින් සිද්ධි නිරූපණය කොට ඇත. ගුණතිලක සහ ඔහුගේ පුතු අතර සිදුවන සංවාදය සේ ම සිරිනාථ දෙණිපිටිය ගුණතිලකගේ පුතු ශිෂ්‍යත්වයට තෝරාගත් බව පැවසීමට ගුණතිලකගේ නිවසට පැමිණීම ද ප්‍රබල සිද්ධි ලෙස නිරූපණය කොට ඇත. |
| සංකේත භාවිතය | ඃ ගුණතිලකගේ චරිතය සමාජවාදී දේශපාලනයේ සංකේතයක් ලෙස යොදා ගනියි. සිරිනාථ දෙණිපිටියගේ චරිතය බටහිර අදහස් කරපින්නා ගත්තෙකු සංකේතවත් කිරීමට යොදා ගනියි.<br>වීරතුංග සහ ගුණතිලකගේ පුත්‍රයාගේ චරිතය ජාතික චින්තනය සංකේතවත් කිරීමට යොදා ගනියි. ගුණතිලක දකින දවල් සිහිනය ද සංකේතයකි. |
| ජීවන දෘෂ්ටිය | ඃ බටහිර රටවල් ක්‍රියාත්මක කරන සූක්ෂ්ම දේශපාලන උපක්‍රම හමුවේ දේශීය චින්තනය බිඳ වැටෙන ආකාරය කෙරෙහි තියුණු නිරීක්ෂණයක් ඉදිරිපත් කෙරේ. |

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**
**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

පන්තියේ සිසුන්ට කෙටිකතාවක මූලික ලක්ෂණ පිළිබඳ කෙටි දෙසුමක් කරන්න.

**පියවර 2**

පුස්තකාල පරිහරණය මගින් කෙටිකතා කලාවේ ආරම්භය හා විකාශයත් කෙටිකතාවක මූලික ලක්ෂණ පිළිබඳව ත් තොරතුරු රැස් කිරීමට සිසුන්ට පවරන්න.

**පියවර 3**

සිසුන් ගවේෂණය කළ කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

**පියවර 4**

සිසු ඉදිරිපත් කිරීම් ද ආශ්‍රය කර ගනිමින් කෙටි සමාලෝචනයක යෙදෙන්න.

ඇගයීම

කෙටිකතාව ජනප්‍රිය සාහිත්‍යාංගයක් වීමට හේතු දක්වන්න.
නවකතාව හා කෙටිකතාව අතර වෙනස්කම් හඳුනාගෙන කෙටිකතාවට අනන්‍ය වූ ලක්ෂණ සටහන් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
'සිංහල කෙටිකතා කලාවේ පුරෝගාමියෝ' නමින් ලිපියක් නිර්මාණය කරන්න.
ආරම්භය
විකාශය
විශේෂ ලක්ෂණ ඔස්සේ කරුණු ඉදිරිපත් කරන්න.

**පරිශීලනීය ග්‍රන්ථ**


අද්‍යතන සිංහල කෙටිකතා 1 - කුලතිලක කුමාරසිංහ
අද්‍යතන සිංහල කෙටිකතා 2 - කුලතිලක කුමාරසිංහ
සිංහල කෙටිකතාවේ කලාත්මක මුහුණුවර - කුලතිලක කුමාරසිංහ
සිංහල කෙටිකතා සංවාද විමර්ශන - කුලතිලක කුමාරසිංහ
කෙටිකතා විචාර මූලධර්ම හා සම්ප්‍රදාය - කුලතිලක කුමාරසිංහ
සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර
සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ
වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ
නිර්මාණ අධ්‍යයනය - සරත් විජේසූරිය
කෙටිකතා කලාව - ජී.බී. සේනානායක
යථාර්ථය හා නිර්මාණය - චන්ද්‍රසිරි පල්ලියගුරු
සම්ප්‍රදාය, නිර්මාණය හා විචාරය - ඒ.වී. සුරවීර
සිංහල කෙටිකතා සංග්‍රහය - සරත් විජේසූරිය/ කුසුමා කරුණාරත්න
කෙටිකතා කලාව - සෝමවීර සේනානායක
සිංහල කතා කලාවේ විකාශනය - කේ. ජයතිලක
නවකතා නිර්මාණය, හා අවබෝධය - ඒ.වී. සුරවීර
බව තිමිර - ඒ.වී. සුරවීර
නිර්මාණ පසුබිම - ඒ.වී. සුරවීර
කෙටිකතා නිර්මාණය මූලධර්ම හා අවබෝධය - රංජිත් ධර්මකීර්ති
සිංහල කෙටිකතාවේ විකාසනය - ඒ.වී. සුරවීර
මාර්ටින් වික්‍රමසිංහ කෘති එකතුව 1 හා 2 වෙලුම් - හැඳින්වීම් ලිපි

නූතන පද්‍ය හා

| | | |
|---|---|---|
| **නිපුණතාව 6.0** | **:** | නූතන පද්‍ය සාහිත්‍ය යුග හඳුනාගෙන විචාර සිද්ධාන්තවලට අනුව නිර්දිෂ්ට පද්‍ය පන්ති රසාස්වාදයේ යෙදෙයි |
| **නිපුණතා මට්ටම** | **:** | 6.1 නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය පැහැදිලි කරයි<br>6.2 නූතන යුගයේ කවියෙහි විවිධතා පැහැදිලි කරයි<br>6.3 සිංහල කවියෙහි නව ප්‍රවණතා ගවේෂණය කරයි<br>6.4 විචාර මූලධර්මවලට අනුව කොළඹ යුගයේ පද්‍ය විචාරය කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 40 යි. |

**ඉගෙනුම් ඵල**

- නූතන පද්‍ය සාහිත්‍යයෙහි එක් එක් යුග හඳුනාගෙන පැහැදිලි කරයි.
- නූතන කාව්‍ය යුග අනුව කවියෙහි විශේෂතා විග්‍රහ කරයි.
- සිංහල කවියෙහි නව ප්‍රවණතා විමර්ශනය කරයි.
- නූතන පද්‍ය රස විඳිමින් ඒවායේ අනන්‍ය ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

- කවිය යනු කුමක් ද? (නිර්වචන කිහිපයක්)

රසය ආත්ම කොටගත් වාක්‍යය කාව්‍යයයි.

**විශ්වනාථ**

කවිය යනු අනුත්සාහසිකව ගලා එන ප්‍රබල හැඟීම් ය.

**විලියම් හැස්ලිම්**

කවිය වනාහි හොඳම වචන හොඳම පිළිවෙලට යෙදීම ය.

**එස්.වී. එලියට්**

රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍යයයි.

**ජගන්නාථ**

- කාව්‍ය විචාර මූලධර්ම
    - කාව්‍ය භාෂාව
    - කාව්‍යෝක්ති (උපමා, රූපක ආදි අලංකාර යෙදුම්)
    - කාව්‍යයක විවිධ ආකෘති
    - විරිත, රිද්මය, ලය
    - පරිකල්පනය/ ප්‍රතිභාව
    - විවිධ කාව්‍ය ශෛලීන්

- නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය

- කොළඹ යුගයේ මුල් පරපුරට අයත් කවීන්
    - ආනන්ද රාජකරුණා
    - ඇස්. මහින්ද හිමි
    - ජී.එච්. පෙරේරා

- කොළඹ යුගයේ දෙවන පරපුරට අයත් කවීන්

  මීමන ප්‍රේමතිලක
  පී.බී. අල්විස් පෙරේරා
  සාගර පලන්සූරිය (කේයස්)
  විමලරත්න කුමාරගම
  එච්.එම් කුඩලිගම

- හෙළ හවුලේ කවීන්

  මුනිදාස කුමාරතුංග
  රැපියල් තෙන්නකෝන්
  අරිසෙන් අහුබුදු

- නිදහස් කවීන්

  ජී.බී. සේනානායක
  සිරි ගුණසිංහ
  ගුණදාස අමරසේකර
  මහගමසේකර
  විමල් දිසානායක

- අති නවීන කවීන්

  මොනිකා රුවන් පතිරණ
  පරාක්‍රම කොඩිතුවක්කු
  දයාසේන ගුණසිංහ
  රත්න ශ්‍රී විජේසිංහ
  ආරියවංශ රණවීර
  යමුනා මාලිනී පෙරේරා
  නන්දන වීරසිංහ
  එරික් ඉලයප්පාරච්චි

**ක්‍රියාකාරකම 1 - කවිය යනු කුමක්දැයි හඳුනා ගැනීම**

**පියවර 1**

සිය අත්දැකීම් අනුව කවිය යනු කුමක් දැයි නිර්වචන සැපයීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 2**

අදාළ කරුණු සහිත පොත් කිහිපයක් හෝ අත්පත්‍රිකාවක් සිසු කණ්ඩායම්වලට ලබා දී කවිය පිළිබඳ නිර්වචන ගවේෂණයක නිරත කරවන්න.

පන්තියට ඉදිරිපත් කර පළමු පියවරේ දී අනාවරණය කරගත් සිසු අත්දැකීම් සමග සසඳන්න.

**පියවර 3**

සිසුන්ගේ ගවේෂණවලින් සොයාගත් නිර්වචන සනාථ කිරීම සඳහා නිදසුන් කවි ඉදිරිපත් කරමින් කවිය පිළිබඳ රසවින්දනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 2 - කොළඹ යුගයේ කවීන් හඳුනා ගනිමු.**

**පියවර 1**

නූතන යුගයේ කවීන් කිහිප දෙනෙකුගේ පින්තූර ප්‍රදර්ශනය කරමින් එම කවීන් පිළිබඳ සංක්ෂිප්ත සාකච්ඡාවක නිරතවන්න.

**පියවර 2**

නූතන කවීන් පිළිබඳ පහත තේමා ඔස්සේ කරුණු ගවේෂණයක සිසුන් නිරත කරවන්න. නූතන කවීන්ගේ ජීවන තොරතුරු

එම කවීන්ගේ නිර්මාණ හා එම නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ (මේ සඳහා කේවල හෝ කණ්ඩායම් ක්‍රමය භාවිතයට ගත හැකි ය.)

**පියවර 3**

ශිෂ්‍ය ගවේෂණ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

නිවැරදි කරුණු තහවුරු කර සටහන් තබා ගැනීමට මග පෙන්වන්න.

සුදුසු පරිදි සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම** 3 - පද්‍ය රසවින්දනය

**පියවර** 1

රසවින්දනයට අදාළ පද්‍යය සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් පන්තියේ ප්‍රදර්ශනය කරන්න. සියලුදෙනාටම එය කියවා ගැනීමට උපදෙස් දෙන්න.

**පියවර** 2

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

කණ්ඩායම තුළ ස්වකීය රසවින්දනාත්මක අදහස් සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දෙන්න.

කණ්ඩායමේ බහුතර අදහස් සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

**පියවර** 3

කණ්ඩායම් ඉදිරිපත්කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.

ශිෂ්‍ය අදහස්ද සැලකිල්ලට ගනිමින් රසවින්දනයක නිරතවන්න.

**නූතන පද්‍ය**

**කවිය හඳුනා ගැනීම.**

නූතන සිංහල කවියෙහි ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය

නූතන කවියෙහි පළමු හා දෙවන යුගවල සිංහල කවියේ විශේෂ ලක්ෂණ හඳුන්වා දීම.

සිංහල කවියේ ගමන්මග සම්බන්ධයෙන් හෙළ හවුලේ කවීන්ගේ දායකත්වය හඳුනා ගැනීම.

නිදහස් කාව්‍ය සම්ප්‍රදායෙහි ප්‍රථම යුගය හා දෙවන යුගය පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම.

කවිය යනු කුමක්දැයි අවබෝධ කර ගැනීම.

පෙර අපර දෙදිග විචාරකයන්ගේ නිර්වචන ඇසුරින් කවිය හඳුනා ගැනිම.

කාව්‍ය විචාර සම්ප්‍රදායයන් පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම.

රසවාදය

අලංකාරවාදය

ධ්වනිවාදය

රීතිවාදය

ඖචිත්‍යවාදය

භාවිත විචාරය ආදිය

"කවියා" හඳුනා ගැනීම.

ප්‍රතිභාව

ව්‍යුත්පත්තිය

සතතාභ්‍යාසය

කවියාගේ කාර්ය භාරය

කවියෙහි අරමුණු

රස නිෂ්පත්තිය

ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යෑම

සමාජ මෙහෙවර

කාව්‍ය නිර්මාණ, විචාරය හා රසවින්දනයට අදාළ මූලික කරුණු පිළිබඳ අවබෝධය.

කාව්‍යානුභූතියෙහි අපූර්වත්වය හා අර්ථවත් බව

රසිකයා තුළ චමත්කාරය දැනවීම (අරමුණ)

කාව්‍යානුභූතිය ප්‍රකාශ කිරීමට උචිත ආකෘතියක් තෝරා ගැනීම.

කාව්‍යමය බස් වහරක් යොදා ගැනීම

| | |
|---|---|
| භාෂාවේ වචනවල | කෝෂාර්ථ |
| | වාච්‍යාර්ථ |
| | ලක්ෂ්‍යාර්ථ |
| | ව්‍යංග්‍යාර්ථ පිළිබඳ අවබෝධය |

ශබ්දාලංකාර හා අර්ථාලංකාර උචිත ලෙස යොදා ගැනීම.

නිර්මාණකරුවාගේ පරිකල්පන ශක්තිය

වස්තු විකාශය හා වස්තු ඒකාබද්ධතාව

කතුවරයාගේ ජීවන දෘෂ්ටිය

සිංහල කවියෙහි නව ප්‍රවණතා හඳුනා ගැනීම.

කවියෙහි ආකෘතිය

කවියෙහි අත්දැකීම

කාව්‍ය භාෂාව

**පක්ෂි භාෂාව**

ප්‍රවේශය

ආනන්ද රාජකරුණා කවියාගේ ප්‍රකට ළමා කවියක් ගායනා කිරීම.

පක්ෂි භාෂාව කවි පන්තිය තාලානුකූල ව ගායනා කිරීම.

ළමා කවිවල විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම හා සාකච්ඡාවක් කිරීම.

හැඳින්වීම්

පක්ෂි භාෂාව ආනන්ද රාජකරුණා කවියා විසින් රචනා කරන ලද්දක් බව

ආනන්ද රාජකරුණා කොළඹ යුගයේ මුල් පරපුරේ කවියකු බව

නූතන යුගයේ මුල් පරපුරේ කවියන්ගේ නිර්මාණවල විශේෂ ලක්ෂණ ඇති බව

ළමයින් උදෙසා නිර්මාණය කරන ලද පද්‍ය පන්තියක් බව

අන්තර්ගතය

කුරුලු නාදය වස්තු විෂය කරගෙන රචනා කොට ඇති බව හඳුනා ගැනීම.

පක්ෂීන්ගේ විවිධ චර්යා රටා හා නාද රටා විවරණය කොට ඇති ආකාරය හඳුනා ගැනිම.

ස්වභාව සෞන්දර්යය ඇගයීමට ලක් කිරීම.

ළමා ජීවිතයට සමීප සුන්දර අත්දැකීමක් ලෙස හඳුනා ගැනීම.

අත්දැකීමෙහි අපූර්වත්වය

කාව්‍යෝපක්‍රම භාවිතය

සුදුසු ආකෘතියක් යොදා ගැනීම "වංශස්ත" නමින් හඳුන්වන සිලෝ විරිතට අයත් ඡන්දසකින් රචනා කොට ඇත.

විරිත ප්‍රස්තුතයට උචිත බව

සරල, සුගම බස් වහරක් යොදා ගැනීම. ළමයින් සඳහා ලියන ලද්දක් හෙයින් බස සරල වීම

විරිත රැක ගැනීම සඳහා ව්‍යාකරණ නොසලකා හරින ලද තැන් ඇත.

උදා ඃ "තෙපි දැනුම් දෙති."

අලංකාර භාවිතයක් නැත. ස්වභාවෝක්තිය පමණක් යොදා ගැනේ.

පුනරුක්ති යෙදී ඇතත් එය දෝෂයක් ලෙස නොපෙනේ. එය ශබ්දාලංකාරයක් ලෙස යෙදෙයි.

ජීවන දෘෂ්ටිය

සොබා දහමට, සොබා දහමේ සොඳුරු දායාදයක් වන පක්ෂීන්ට ආදරය කළ යුතු බව

ඇගයීම

ආනන්ද රාජකරුණා කවියාගේ ළමා කවි පිළිබඳ විමර්ශනයක් කරන්න.

"පක්ෂිභාෂාව" කුඩා දරුවන් තුළ සොබා දහමට ආදරය කිරීමේ ඇල්ම දියුණු කරන්නකි. විමසන්න.

කොළඹ යුගයේ මුල් පරපුරේ කවියන්ගේ කාව්‍ය නිර්මාණවල ඇති විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

## දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල

ප්‍රවේශය

නිර්දිෂ්ට පද්‍ය ඇතුළත් දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල කාව්‍ය ග්‍රන්ථය හඳුනා ගැනීම.
අදාළ පද්‍ය තාලානුරූපව ගායනා කිරීම.
පද්‍ය නිර්මාණයෙන් ජනිත කාව්‍යමය රස පිළිබඳ සාකච්ඡා කිරීම.

හැඳින්වීම්

ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමියන්ගේ වෙනත් කාව්‍ය නිර්මාණ පිළිබඳ සාකච්ඡාවක නිරතවීම.
උන්වහන්සේගේ විවිධ නිර්මාණ සඳහා පාදක කරගත් අනුභූතීන් හඳුනා ගැනීම.
සමකාලීන සමාජ වාතාවරණය ස්වකීය නිර්මාණ සඳහා පාදක කර ගත් බව
කාව්‍ය නිර්මාණ සඳහා තෝරාගත් ආකෘතීන් හඳුනා ගැනීම.

අන්තර්ගතය

ළදරු වියේ සිට ම ශ්‍රී ලාංකිකයා තුළ ස්වකීය දේශය, ජාතිය, ආගම පිළිබඳ අනුරාගයක් හා අභිමානයක් ඇති කිරීම.
අතීත ශ්‍රී විභූතිය ස්මරණය කරමින් වර්තමානය ගොඩනංවා ගැනීම.
උපන් දේශයට ණය නැත්තෙකු ලෙස ජීවත් විය යුතු බව.
තොටිල්ලේ සිට ම දේශය, ජාතිය හා ආගම වෙනුවෙන් යුතුකම් පුරුදු පුහුණු කළ යුතු බව.

කාව්‍යෝපක්‍රම භාවිතය

ළමා මනස ආකර්ෂණය කර ගත හැකි කාව්‍ය විරිතක් භාවිත කිරීම. (මාත්‍රා 12 න් සැකසූ පද්‍ය පාද ඇති පෙද විරිත)
තොටිල්ලේ නැළවෙන ළදරුවෙකුට යෝග්‍ය භාෂා රටාව
අර්ථ රසය මතුවන ලෙස නිර්මාණය කිරීම.
සරල උපමා රූපක භාවිතය හා ඉන් ගැඹුරු අරුතක් ධ්වනිත කිරිම.
එළිසමය අනුප්‍රාස වැනි කාව්‍ය උපක්‍රම භාවිතය.
මුඛ්‍ය අදහස තීව්‍ර කර ගැනීමට ස්වකීය කවිත්වය ප්‍රයෝජනයට ගැනීම.

ජීවන දෘෂ්ටිය

ස්වකීය දේශය, ජාතිය, ආගම වෙනුවෙන් දැඩි ආලයකින් කටයුතු කළ අතීත විරුවන් හඳුනා ගැනීම හා ඒ මතින් වර්තමානය ගොඩ නංවා ගැනීම.
දේශයේ විමුක්තිය වෙනුවෙන් වත්මන් ළමා හා තරුණ පරපුර කැප විය යුතු බව
දේශයට ණය නැත්තෙකු ලෙස මියයාම උතුම් බව

ඇගයීම

කවියාගේ සමකාලීන සමාජ වාතාවරණය පිළිබඳ කරුණු ගවේෂණයට යොමු කරවීම.
දේශාභිමානී කාව්‍ය නිර්මාණ සොයා ඇගයුමට ලක් කරවීම.
නිර්මාණ කාර්යයන් කෙරෙහි යොමු කරවීම.

**පරලොවට පණිවුඩයක්**

ප්‍රවේශය

යොදාගත් කාව්‍ය විරිත හා එහි ගායනා ස්වරූපය හඳුනා ගැනීම.
කාව්‍ය නිර්මාණය තාලානුරූපව ගායනා කිරීම.
කාව්‍ය රසාස්වාදය කෙරෙහි අවධානය යොමු කිරීම.

හැඳින්වීම

නූතන යුගයේ කවීන් අතර ජී.එච්. පෙරේරා කවියාට හිමි තැන හඳුනා ගැනීම.
ජී.එච්. පෙරේරා කවියාගේ වෙනත් කාව්‍ය නිර්මාණ පිළිබඳ දැනුවත් කිරීම.
"පරලොවට පණිවුඩයක්" කාව්‍ය නිර්මාණයෙහි අනුභූතිය කවරේදැයි හඳුනා ගැනීම හා එහි විශේෂතාව කවරේදැයි දැනගැනීම.

අන්තර්ගතය

ජාතික අනන්‍යතාව අමතක කළ සමාජයක ස්වභාවය ගැන අවධානය යොමු කිරීම.
බටහිර සිරිත් විරිත්වලට ගැති සිංහලයන් උපහාසයට ලක්කිරීම.
ආදි ලාංකිකයන්ගේ අභිමානවත් ගති සිරිත් සිහිපත් කිරීම.
ඉංග්‍රීසි අධ්‍යාපනයට අන්ධානුකරණයෙන් යොමුවීම නිසා සිංහල භාෂාව අමතක කිරීම.
නිලතල, තාන්න මාන්න අපේක්ෂාවෙන් බටහිර ජාතීන්ට ගැතිකම් කරන්නවුන්ගේ ස්වභාවය හඳුනා ගැනීම.
පුළුල් සමාජ ශෝධනයක අවශ්‍යතාව මතු කර දැක්වීම.

කාව්‍යෝපක්‍රම භාවිතය

තේමාවට උචිත කාව්‍ය ආකෘතියක් යොදා ගැනීම (සිලෝ විරිතට අයත් මාලිනී විරිත)
කවියේ මුල, මැද සුදුසු අවස්ථාවල එළිසමය යෙදීම.
පරලොවින් මෙලොවට පැමිණෙන්නෙකුට මේ රටේ ස්වභාවය හඳුන්වාදෙන ආකාරයේ අපූර්ව උපක්‍රමයක් භාවිත කිරීම.
පුද්ගල දුර්වලතා, නිවට නියාලුකම්, මදිපුංචිකම් උපහාසයට ලක් කිරීමට සුදුසු භාෂා භාවිතය.
ව්‍යවහාර භාෂාව මෙන් ම ගැමි යෙදුම් ද භාවිතයට ගැනීම.

ජීවන දෘෂ්ටිය

සමාජය තුළ පවතින විවිධ දුර්වලතා, අඩු ලුහුඬුකම්, නිවට නියාලුකම් උපහාසයෙන් යුතුව ඉදිරිපත් කිරීම.
එකී දුර්වලතාවලින් මිදුණු සමාජ පරිසරයක් ගොඩනංවා ගැනීමට මං පෙත් හෙළි කිරීම.
මේ පිළිබඳ ගැඹුරින් සොයා බැලීමට සහෘදයා යොමු කිරීම.
සමාජ සංශෝධනයක අවශ්‍යතාව මතුකිරීම.

ඇගයීම

ජාතික අභිමානය පදනම් කරගත් වෙනත් කාව්‍ය නිර්මාණ කෙරෙහි අවධානය යොමු කරන්න.
එම කාව්‍ය නිර්මාණ කිහිපයක් පිළිබඳ ඇගයීමක් කරන්න.
ජාතිකාභිමානය ගැබ්වුණු ගීතවල කාලීන අවශ්‍යතාව පිළිබඳ අදහස් දක්වන්න.

**හිඟන්නා**

ප්‍රවේශය

කුමාරතුංග මුනිදාස සූරීන්ගේ භාෂා සාහිත්‍ය සේවය පිළිබඳ සාකච්ඡාවක්.
පද්‍ය පන්තිය ගායනා කිරීම.
පද්‍ය පන්තියේ මුඛ්‍යාර්ථය හඳුනා ගැනීමේ සාකච්ඡාවක්.

හැඳින්වීම

"හිඟන්නා" කුමාරතුංග මුනිදාස සූරීන්ගේ ශික්ෂා මාර්ගය දෙවන පොතින් උපුටා ගන්නා ලද පද්‍ය පන්තියක් බව
ළමා කාව්‍ය නිර්මාණයක් බව
කුමාරතුංග මුනිදාස මහතා නූතන යුගයේ මුල් පරපුරේ කවියෙකු බව
එතුමා සිංහල භාෂාවේ හා සාහිත්‍යයේ උන්නතිය සඳහා විශිෂ්ට මෙහෙවරක් කළ වියතෙකු බව
එතුමා අතින් රසවත් පද්‍ය රචනා රැසක් ලියැවී ඇති බව
එතුමා හෙළ හවුලේ නිර්මාතෘ බව

අන්තර්ගතය

හිඟන්නෙකුගේ කටුක ජීවිතය වස්තු විෂය කරගෙන රචනා කරන ලද කවි පන්තියකි.
හිඟන්නෙකුගේ ම මුවින් පිටවන දුක් අඳෝනාවක ස්වරූපයෙන් රචනා වූවකි.
හිඟන්නා පිළිබඳ වූ තොරතුරු සජීවී ලෙස ඉදිරිපත් කිරීමට සමත් වේ.
හිඟන්නාගේ අසරණ බව හා ජීවිතය පිළිබඳ වූ කළකිරීම තියුණු ලෙස ඉදිරිපත් කෙරෙයි.
හිඟන්නා පිළිබඳ අනුකම්පා සහගත හැඟීමත් සමග කරුණ රසය ඉස්මතු වෙයි.

කාව්‍යෝපක්‍රම භාවිතය

විරිත ඃ විසමපාදවල (1-3) මාත්‍රා 14 බැගින් ද සමපාදවල (2 - 4) මාත්‍රා 16 බැගින් ද යෙදෙන ගී විරිතක් යොදාගෙන ඇත.
හිඟන්නෙකුගේ දුක් අඳෝනාවක් ප්‍රකාශ කිරීමට ආකෘතියක් යොදාගෙන ඇති බව
අත්දැකීම ප්‍රකාශ කිරීමට උචිත සරල බස් වහරක් යොදාගෙන තිබීම.
හිඟන්නාගේ දුක්ඛිත ජීවිතය ප්‍රකාශ කිරීමට උචිත කාව්‍යෝක්ති යොදා ගැනීම.
ප්‍රස්තුතයට උචිත සංකල්ප රූප යොදා ගැනීම.

උදා ඃ ලොව ගේ අහසයි පියස්ස ..... (රූපක)

විරිත රැකීමට පද විකෘත නොකිරීම.
නැත, නෑ, බෑ, අහෝ, අනේ යන යෙදුම්වලින් මතුවන ධ්වනිතාර්ථ

ජීවන දෘෂ්ටිය

සිඟාකෑමෙන් ජීවත්වන දුක්ඛිත මිනිසුන් පිළිබඳ ව අනුකම්පා කළ යුතු බව

ඇගයීම

කුමාරතුංග මුනිදාස සූරීන්ගේ කාව්‍ය නිර්මාණවල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න.
"හිඟන්නා" රසිකයාගේ හදවත දයානුකම්පාවෙන් පුරවා දමන කාව්‍ය රචනයකි විමසන්න.

## වවුලු හමුව

### ප්‍රවේශය

කවි පන්තිය ගායනා කිරීම.
"වවුලුව" කාව්‍ය ග්‍රන්ථය පිළිබඳ හැඳින්වීමක්
හෙළ හවුලේ කවියන් පිළිබඳ සාකච්ඡාවක්

### හැඳින්වීම

"වවුලු හමුව" රැපියෙල් තෙන්නකෝන් කිවිඳුන්ගේ "වවුලුව" කාව්‍ය ග්‍රන්ථයෙන් උපුටා ගෙන ඇති බව
පද්‍ය 557 කින් පරිමිත වවුලුව හෙළයේ මහා උපහාස කාව්‍යයක් බව
කැවිඩියක හා වවුලෙකු අතර රැයක් පුරා ඇතිවන සංවාදයක් මගින් කතාව විකාශනය වන බව
කැවිඩිය, වවුලා, රාවණ, විභීෂණ, රාම, ලක්ෂ්මන්, සීතා, හනුමන් මෙහි ඇතුළත් චරිත වන බව
රාමායණයෙහි එන කතාව තුළින් ම රාවණයන්ගේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු කිරීම කතුවරයාගේ අරමුණ වන බව
වවුලුව කාව්‍ය නිර්මාණය සඳහා විවිධ විරිත් යොදාගෙන ඇති බව

### අන්තර්ගතය

අනුරාධපුර අබය වැව් ඉවුරේ මසන් ගසක කවුඩු කැදැල්ලකි. එහි කවුඩු යුවළක් පැටියෙකු ද සමග වාසය කරති. කවුඩා ගොදුරු සොයා උදේ ම පිට වී ගියත් අඳුර වැටෙනතුරුත් නිවසට නො පැමිණියෙන් කැවිඩිය බියෙන්, සෝකයෙන් හා කෝපයෙන් මග බලා සිටින්නී ය. අඳුරේ පැමිණෙන සැමියාගේ රුව දුටු ඇය ඇසෙන පමණට ළංවූ විට සැර පරුෂ වචනයෙන් බැණ වදියි. එහෙත් ඒ පැමිණියේ සැමියා නොව වවුලකු බව දුටු ඇය කට වැරදුණ බව තේරුම් ගත්තා ය.
වවුලුවේ ප්‍රධාන චරිත දෙක හමු වූ අවස්ථාව නිරූපණය වේ.
කැවිඩියගේ ගැහෙන, උතුරන කෝපයේ ස්වභාවයත්, සැමියා යයි සිතා වවුලාට බැණ වදින ආකාරයත් උපහාසය දනවමින් විවරණය වෙයි.

### කාව්‍යෝපක්‍රම භාවිතය

ප්‍රකට සමුද්‍රඝෝෂ වෘත්තයෙන් රචනා කළ බව කවි කතාවට ගැළපෙන විරිතක් යොදාගත් බව
ප්‍රස්තාවෝචිතව කාව්‍යමය බස් වහරක් යොදා ගෙන ඇති බව
කැවිඩියගේ හැඟීම් හා ඉරියව් සජීවී ලෙස ප්‍රකාශ කිරීමට උචිත භාෂාවක් යොදා ගැනීම.
විශේෂ කාව්‍යෝක්තීන් නිර්මාණය

ව්‍යංග්‍යාර්ථවත් බස් වහරක් යොදා ගැනීම

උදා ඃ හොට මැදගෙනැ
දිව ගත උගු දුන්නා

විසිතුරු උපමා භාවිතය

උදා ඃ නටන සේ ඇංජිමක්
බත් සැළියක් බඳු ව
වන් ලෙස ඇසිණි හෙණයක් සක්වල ගලට

අනුප්‍රාස සහිත යෙදුම්

උදා ඃ කට බොරුමැ කිය කියා
පැන පැන ගැහෙන හද තද කොටැ
නටා ගසා ගොස්

සංවාදාත්මක කාව්‍යෝක්ති

ජීවන දෘෂ්ටිය

මිනිස් ගති ලක්ෂණ කැව්ඩියගේ චර්යාව තුළින් ඉස්මතු කරමින් උපහාසයට ලක් කිරීම.

ඇගයීම

දක්ෂ කවියෙකුට සාර්ථක කාව්‍ය නිර්මාණයක් බිහිකිරීමට සාම්ප්‍රදායික ආකෘතීන් බාධාවක් නොවන බව "වවුලු හමුව" කවි පන්තිය ඇසුරින් පැහැදිලි කරන්න.

කවි පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

"වවුලු හමුව" තුළින් කතුවරයාගේ භාෂා ප්‍රභූත්වය පැහැදිලි කරන්න.

**අන්ධ කවියා**

ප්‍රවේශය

කවි පන්තිය ගායනා කිරීම.

අල්විස් පෙරේරා කවියාගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ සාකච්ඡාවක්

කොළඹ යුගයේ දෙවන පරපුරේ  කවිය පිළිබඳ සාකච්ඡාවක්

හැඳින්වීම්

පී.බී. අල්විස් පෙරේරා කවියාගේ නිර්මාණයක් බව

අල්විස් පෙරේරා කොළඹ යුගයේ දෙවන පරපුරේ කවියකු බව

කොළඹ යුගයේ දෙවන පරපුරේ කවියන්ගේ කාව්‍ය නිර්මාණවල විශේෂත්වයක් ඇති බව

අල්විස් පෙරේරා ස්වභාව සෞන්දර්ය, සමාජ අසාධාරණය, පන්ති අරගලය ආදී විවිධ තේමා අනුව කවි නිර්මාණය කොට ඇති බව

අන්තර්ගතය

කවි පන්තිය අන්ධ කවියෙකුගේ ආත්ම භාෂණයක් ලෙස ඉදිරිපත් වේ.

මියගිය සිය බිරිඳ පිළිබඳ වූ අතීත අනුස්මරණයන් සමග කවියාගේ සිතෙහි පහළ වන අනුවේදනීය හැඟීම් වස්තු විෂය වී ඇත.

ප්‍රිය විප්‍රයෝගය හේතුවෙන් හටගන්නා වූ දුක්ඛ දෝමනස්සයන් සහ අන්ධභාවය හේතුවෙන් හටගත්තා වූ අසරණ බව මුල් කොට ගෙන පහළ වන ශෝකී භාවයන් හෙළි කරයි.

අන්ධ කවියා තම සුරතල් දියණිය අමතා කරන ප්‍රකාශයක ව්‍යාජයෙන් කවි පන්තිය විකාශය කර ඇත.

කවියාට දැනෙන පරිසර ස්වභාවයන් ඔහුගේ භාවයන් අවදි කිරීමට හේතු වේ.

කාව්‍යෝපක්‍රම භාවිතය

එක් පාදයකට මාත්‍රා 30 බැගින් වූ සිවුපද විරිතක් කාව්‍ය නිර්මාණය සඳහා යොදාගෙන ඇත.

කවියාගේ සන්තානයෙහි පහළ වූ ශෝකී ස්වරයෙහි රිද්මය ප්‍රකාශ කිරීමට උචිත ධ්වනියක් මතු කිරීමට විරිත හේතු වෙයි.

ව්‍යවහාරෝචිත සරල බස්වහරක් යොදාගෙන කවියාගේ මනෝභාවයන් ගැඹුරින් විවරණය කිරීමට සමත් වී ඇත.

ශබ්ද රසය හා අර්ථ රසය උද්දීපනය කරන කාව්‍යෝක්ති සාර්ථක ලෙස යොදා ගනියි.

ව්‍යංග්‍යාර්ථවත් බස් වහරක් යොදා ගැනීම

උදා ඃ මායා සිහිනය මැද්දේ පීනමි
ලෝකය පිබිදී දොඩමලු වී ඇත
ආලය උල්පත් දෙතැනක පිපිරී

ප්‍රබල සංකල්ප රූපාවලියක් මගින් මුඛ්‍යාර්ථය ඉස්මතු කිරීම.

උදා ඃ වැව් බන්දේසිය සොබා සොඳුරි වෙත
රන්මල් මදහස

ජීවන දෘෂ්ටිය

දුක්ඛ දෝමනස්සයන්ගෙන් ගහණ වූ ජීවිතය පිළිබඳ එක් යථාර්ථයක් පසක් කර ගැනීමට සුදුසු අනුභූතියක් ලෙස ඉදිරිපත් කෙරේ.

ඇගයීම

අන්ධකවියාගේ සිතිවිලි කැඳවාගෙන යෑමට පරිසරය කොතරම්දුරට බලපා ඇත් ද?

පී.බී. අල්විස් පෙරේරා කවියාගේ කාව්‍ය නිර්මාණවල දක්න ලැබෙන විශේෂතා පැහැදිලි කරන්න.

කවි පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**පරිණාමා**

ප්‍රවේශය

සාගර පලන්සූරිය කවියාගේ වෙනත් පද්‍ය නිර්මාණයක් ගායනා කිරීමට සැලැස්වීම.
"පරිණාමා" පද්‍ය නිර්මාණය තාලානුරූපව ගායනා කිරීම.
නිර්මාණයෙන් ඉදිරිපත් කෙරෙන අදහසත් සමග රස වින්දනය පිළිබඳ සාකච්ඡා කිරීම.

හැඳින්වීම්

"පරිණාමා" නිර්මාණකරුවා පිළිබඳ ව සාකච්ඡා කිරීම.
සාගර පලන්සූරිය කොළඹ යුගයේ කවියෙකු බව හඳුනා ගැනීම.
සමස්ත සමාජයට ම සාධාරණ යථාර්ථයක් කවි පන්තියෙන් ඉදිරිපත් වන බව
සාගර පන්සූරිය කවියා තම කාව්‍ය නිර්මාණයන් සඳහා යොදාගත් අනුභූතීන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම.

අන්තර්ගතය

කෙළිලොල් අවධියේ සිට වගකීම් සහිත වැඩිහිටි අවධිය දක්වා ජීවිතයක පරිණාමයේ විවිධ  අවස්ථා විග්‍රහ කිරීම
ඒ සඳහා සුන්දර කාන්තා ජීවිතයක විවිධ අවස්ථා අපූර්වත්වයකින් යුතු ව භාවිතයට ගැනීම.
ලොව යථාස්වභාවය දක්වමින් ජීවිතයක පරිණාමය සමස්ත සමාජයට ම පොදු බව පැහැදිලි කිරීම.

කාව්‍යෝපක්‍රම භාවිතය

ඉතා සරල ගැමි බස් වහරක් යොදා ගැනීම.
සරල විරිතක් භාවිතයට ගැනීම.
සැම තරාතිරමක අයෙකුට ම රස විඳිය හැකි පරිද්දෙන් ඉදිරිපත් කිරීම.
ස්වාභාවික පරිසරය ඇසුරින් සරල උපමා රූපක නිර්මාණය කර ගැනීම.
කාන්තාවකගේ සුන්දරත්වය යොදා ගනිමින් ජීවිතයක විවිධ අවස්ථා නිරූපණය කිරීම.

ජීවන දෘෂ්ටිය

පරිණාමීය අවස්ථා පෙන්නුම් කරමින් සැම අයෙකුගේ ම ජීවිතය අවසන් වන බව
කාන්තාවකගේ සුන්දරත්වය උපතේ සිට මිය යාම තෙක් ම විවිධ ස්වරූපවලින් පෙන්නුම් කෙරෙන බව
ලොව පවතින යථාස්වභාවයෙහි පොදු බව ධ්වනිත කිරීම.

ඇගයීම

ජීවිතයක යථාස්වභාවය දක්වන මෙවැනි කාව්‍ය හා ගීත නිර්මාණ සොයා විමර්ශනය කරන්න.
කාව්‍ය නිර්මාණකරණය කෙරෙහි යොමු කිරීම.

**හේරත් හාමි**

ප්‍රවේශය

කවි පන්තිය ගායනා කරමින් රස වින්දන සාකච්ඡාවක් කිරීම.
විමලරත්න කුමාරගම කවියාගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීම.

හැඳින්වීම

"හේරත්හාමි" විමලරත්න කුමාරගම කවියාගේ නිර්මාණයක් බව
විමලරත්න කුමාරගම පරිපාලන නිලධාරියෙකු වශයෙන් ජන ජීවිතය යථාර්ථයෙන් අවබෝධ කර ගත් කවියෙකු බව
ජන ජීවිතයෙහි අනුවේදනීය අත්දැකීම් ඔහුගේ කාව්‍ය නිර්මාණවලට පාදක වී ඇති බව
"හේරත්හාමි" නමැති චරිතය පාදක කොට ගෙන රචනා කොට ඇති බව

අන්තර්ගතය

හේරත්හාමිගේ චරිත ස්වභාවය විවරණය කරමින් ඔහු පිළිබඳ අනුවේදනීය හැඟීමක් රසිකයා තුළ දැනවීම කවියාගේ අරමුණ වී ඇත.
කසළ ශෝධනය, මළ මිනී කැපීම වැනි කම්කරු වෘත්තියක නිරත වුව ද ඔහු අවිහිංසක, නිහතමානී අයකු බව කවියා කියයි.
හේරත්හාමිගේ චරිතයේ විස්මය දනවන අවස්ථාවක් ලෙස ඔහුගේ නැගණියගේ මරණය කවියා හඳුන්වයි.
පීඩිත පන්තියේ ජනයාගේ දුක දැකීමෙන් කවියාගේ සිත සසල වූ ආකාරය පද්‍ය පන්තියෙන් ප්‍රකට වෙයි.

කාව්‍යෝපක්‍රම භාවිතය

සාම්ප්‍රදායික කවි සමය අනුව යමින් සමුද්‍රඝෝෂ විරිතෙන් රචනා කරන ලද කවි පන්තියකි.
වස්තු විකාශයේ සාර්ථකතවයට විරිත හේතු වී ඇත.
ව්‍යවහාරෝචිත සරල බස් වහරක් යොදා ගෙන ඇත.
චරිත ස්වභාවය ඉස්මතු කොට දැක්වීමට උචිත කාව්‍යෝක්ති යොදා ගැනීම.

උදා ඃ

ඔහු මට වඩා විසි තිස් ගුණයෙන් දැමී
හැඬුව නමුත් ඔහු නැගණිය මැරුණු දිනේ
උණගත්දාට වැලපෙයි නෙත කඳුළු පෙනේ

ජීවන දෘෂ්ටිය

පීඩිත පන්තියේ මිනිසුන්ගේ ජීවිත දෙස එබී බලමින් ඔවුන් පිළිබඳ ළයෙහි උපන් කරුණාව පළ කෙරේ.

ඇගයීම.

හේරත්හාමිගේ චරිතයෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.
විමලරත්න කුමාරගම ජන හද හඳුනාගත් කවියෙකි. විමසන්න.
සාම්ප්‍රදායික කාව්‍ය ආකෘතියත් ව්‍යවහාර බසත් වර්තමාන කාව්‍යානුභූතීන් ප්‍රකාශ කිරීමට බාධාවක් වී නැති බව "හේරත්හාමි" කවි පන්තියෙන් පැහැදිලි කරන්න.

**රුව දැකීම**

ප්‍රවේශය

ජී.බී. සේනානායක සූරීන්ගේ ජීවන චරිතයෙහි පැවති සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම.
සිංහල නිසඳැස් ආරම්භක අවස්ථාව පිළිබඳ ව සාකච්ඡා කිරීම.
"රුව දැකීම" නිර්මාණය කියවා ඉන් ධ්වනිත අර්ථය විමසා බැලීම.

හැඳින්වීම

"රුව දැකීම" ජී.බී. සේනානායකගේ "පළිගැනීම" නම් කෘතියෙන් උපුටා ගත්තක් බව
එහි ඇතුළත් නිර්මාණ පිළිබඳ ව ජී.බී. සේනානායකයන් දැක්වූ අදහස් විමසා බැලීම.
ජී.බී. සේනානායක සූරීන්ගේ නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම.
සමකාලීන වෙනත් කවීන් නිසඳැස් පිළිබඳ ව කළ අත්හදාබැලීම් විමසා බැලීම.

අන්තර්ගතය

එක්තරා රජතුමෙකු පස් වසක් ගම් නියම්ගම්වල සැරිසරා විවාහ කොටගත් කුමරිය පස් වසකට පසු මාළිගයට කැඳවාගෙන ආ දිනයේ දී ම දුටු දොරටු පාලකයින් දියණිය වඩා රූමත් බව කුමරාට සිත්වීම.

කාව්‍යෝපක්‍රම භාවිතය

කෙටි වදන් සමගින් බස හසුරුවාගෙන ඇති අපූර්වත්වය.
නිර්මාණය පුරා දක්නට ලැබෙන සංක්ෂිප්ත බව
සංකල්ප රූප නිර්මාණය කිරීමට දක්වන සාමර්ථ්‍යය.
අනුභූතිය ඉදිරිපත් කළ අපූර්වත්වය.

ජීවන දෘෂ්ටිය

පුද්ගල සන්තානගත ආශාවන්ගේ සීමා රහිත බව
කාලයට සාපේක්ෂව රුචිකත්වය වෙනස් වන බව
නිරන්තරයෙන් නෙත ගැටෙන දෙයක අපූර්වත්වයක් නොදකින බව

ඇගයීම.

"රුව දැකීම" නිර්මාණයෙහි පවත්නා විශේෂතා හඳුනා ගැනිම.
නිසඳැස් පිළිබඳ ව ජී.බී. සේනානායක සූරීන් "පළිගැනීම" කෘතියෙහි දක්වන අදහස් විමසීම.
සිංහල පද්‍යයෙහි ආකෘතිය හා අන්තර්ගතය සම්බන්ධයෙන් නිදහස් පද්‍ය රචකයන් කළ අත්හදා බැලීම් විර්ශනය කිරීම.

**කතරගම**

ප්‍රවේශය

ගුණදාස අමරසේකර මහතා කවියෙකු පමණක් නොව වෙනත් සාහිත්‍ය කෘති රචනයෙහි ද නියුක්ත වූවෙකු වශයෙන් හඳුනා ගැනීම.

ගුණදාස අමරසේකර කවියාගේ කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ හඳුනා ගැනීමේ සාකච්ඡාවක් පැවැත්වීම.

හැඳින්වීම

ගැඹුරු සංකල්ප නිර්මාණකරණයෙහි යොදා ගන්නෙකු ලෙස නිර්මාණකරුවා හඳුනා ගැනීම.

බුද්ධිමය ජීවිතයත්, භාවමය ජීවිතයත් අතර පවතින ගැටුමේ ස්වරූපය විග්‍රහ කිරීම.

අන්තර්ගතය

තර්කානුකූල බුද්ධිය යටපත් ව භක්තිය මත පදනම් වූ භාවමය ජීවිතය මතු ව එන ආකාරය පෙන්වාදීම.

දෙවොලක් තුළ සිදුවන පුද පූජා බාරහාර වීම් යාතිකා යනාදිය තර්කානුකූල බුද්ධියට හසු නොවුණ ද බුද්ධියෙන් ප්‍රතික්ෂේප කිරීමට අපොහොසත් වීම.

මනැසත් මසැසත් එකිනෙක අන්ධ ව පවතින අවස්ථාවන් පිළිබඳ ව අවධානය යොමු කිරීම.

නිර්මාණය වන පරිසරය සමග බුද්ධිය යටපත් ව හැඟීම් ඉස්මතු වන ආකාරය.

කාව්‍යෝපක්‍රම භාවිතය

භාවිත භාෂා රටාව ගැන විශේෂ අවධානය යොමු කිරීම.

ස්වකීය කාව්‍යානුභූතිය ඉදිරිපත් කිරීම සඳහා යොදාගත් කාව්‍යමය ආකෘතිය හා විරිත් භාවිතය පිළිබඳ සොයා බැලීම.

දෙවොලක සිදුවන විවිධ ක්‍රියාකාරකම් හා යාතිකාදිය මගින් සංකල්ප රූප මතු කිරීම.

ඇතැම් කාව්‍යෝක්ති නැවත නැවත යෙදීමෙන් නිර්මාණයට ලබා ගන්නා ආලෝකය.

ගැඹුරු සංකල්පයක් විචිත්‍රව ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ කිරීම.

ජීවන දෘෂ්ටිය

ජීවිතයක බුද්ධිමය මෙන් ම භාවමය පක්ෂය ද සමබර ව පැවතිය යුතු බව

තර්කානුකූල බුද්ධියෙහි පිහිටා සිටිය ද අවස්ථාව, සුදුසු පරිසරය පැමිණිවිට භාවමය ජීවිතය ඉස්මතු ව පැමිණිය හැකි බව

බාහිර සාධක මගින් ජීවිතයේ බුද්ධිමය හා භාවමය ස්වරූපයන් හසුරුවන අයුරු.

ඇගයීම.

ගුණදාස අමරසේකර මහත්මාගේ වෙනත් සාහිත්‍ය නිර්මාණ පිළිබඳ අධ්‍යයනයක යෙදවීම.

"කරතගම" පද්‍ය නිර්මාණයෙහි පවත්නා තාලානුරූප බව වෙනත් නිර්මාණ සමග සැසඳීම හා ගවේෂණය කිරීම.

මෙම බුද්ධිය හා භාවයන් අතර ගැටුම සාමාන්‍ය ජීවිතයට බලපාන අයුරු සාකච්ඡාවට යොමු කිරීම.

**දිවා භෝජනය**

ප්‍රවේශය

කවි පන්තිය කියවා රසවින්දන සාකච්ඡාවක් කිරීම.
සිරිගුනසිංහ කාව්‍ය නිර්මාණ පිළිබඳ සාකච්ඡාවක්.

හැඳින්වීම

"දිවා භෝජනය" සිරි ගුණසිංහගේ කාව්‍ය නිර්මාණයක් බව
සිරි ගුනසිංහ නිසඳැස් කාව්‍ය සම්ප්‍රදායේ පුරෝගාමියෙකු බව
"දිවා භෝජනය" ඔහුගේ "අභිනික්මන" පද්‍ය සංග්‍රහයෙන් උපුටා ගන්නා ලද්දක් බව
නිසඳැස් කවියෝ සිංහල කවියේ අකෘතීන් මෙන් ම අත්දැකීම් සම්බන්ධයෙන් ද අත්හදා බැලීම් කළ බව

අන්තර්ගතය

කුඩා දරුවකු තම දිවා ආහාරය ලබා ගත් ආකාරය කාව්‍ය වස්තුව වශයෙන් හඳුනා ගත හැක.
පන්ති විෂමතාව පිළිබඳ කතුවරයාගේ විරෝධාකල්පය "දිවා භෝජනය" යනුවෙන් කවි පන්තිය නම් කිරීමෙන් හෙළිවේ.
දරිද්‍රතාව හේතුවෙන් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවකුගේ හැඩ රුව කදිමට චිත්‍රණය කරයි.
කවියේ සමාජ මෙහෙවර පිළිබඳ අරමුණ කෙරෙහි කවියාගේ අවධානය යොමු වී ඇත.

කාව්‍යෝපක්‍රම භාවිතය

නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය අනුව රචනා කරන ලද්දකි.
කවියාට රිසි පරිදි පද බෙදා, දක්වමින් කවියේ ප්‍රස්තුතයට උචිත ආකෘතියක් නිර්මාණය කරගෙන ඇත.
මනා සංයමයකින් බස හසුරුවමින් සිය විරෝධාකල්පය ප්‍රකාශ කිරීමට කවියා සමත් වී ඇත.
කවියාගේ බස රූපකාර්ථවත් ය.

උදා ඃ

නොදරුවා .. ඇට සැකිල්ලකි
ලී කැබෙල්ලක් සුරත

පද වෙන් කිරීමෙන් ප්‍රබල සංකල්පයක් ගොඩ නගයි.

උදාඃ

පොඩි ළමයෝ
බත්
ඉවරද කාලා

ජීවන දෘෂ්ටිය

සමාජ දරිද්‍රතාවයේ යථා ස්වරූපය

**පරිශීලනීය ග්‍රන්ථ**


| | |
|---|---|
| පද්‍යාවලී | - සාගරපලන්සූරිය |
| නවීන පද්‍ය රචනා | - මීමන ප්‍රේමතිලක |
| නව කවි සංග්‍රහය | - කුසුමා කරුණාරත්න<br>සරත් විජේසූරිය |
| සිංහල කාව්‍ය සංග්‍රහය | - ආරිය රාජකරුණා |
| සාහිත්‍ය විද්‍යාව | - එදිරිවීර සරච්චන්ද්‍ර |
| කල්පනා ලෝකය | - එදිරිවීර සරච්චන්ද්‍ර |
| ගිරිකුල හා සඳමඬල | - විමල් දිසානායක |
| නිර්මාණය හා විචාරය | - විමල් දිසානායක |
| නිර්මාණ අධ්‍යයනය | - සරත් විජේසූරිය |
| නව කවි අධ්‍යයනය | - සරත් විජේසූරිය |
| සිංහල කාව්‍යයේ නව ප්‍රවණතා | - අඟළුගහ ධම්මින්ද හිමි |
| නිර්මාණ පසුබිම | - ඒ.වී. සුරවීර |
| පලිගැනීම | - ජී.බී. සේනානායක |
| අලියා හා අන්ධයෝ | - ගුණදාස අමරසේකර |
| භාව ගීත | - ගුණදාස අමරසේකර |
| කවිය, ගීතය හා සමාජය | - එබ්ලිව්. ඒ. අබේසිංහ |
| නූතන කාව්‍ය සංහිතා | - සුනිල් ආරියරත්න |
| නව කවි සරණිය | - විමල් දිසානායක |
| නව කවි විමසුම | - මොනිකා රුවන් පතිරණ |

**භාෂාව හා ව්‍යාකරණය**

**නිපුණතාව 7.0** : අක්ෂර, පද, වචන, වාක්‍ය ආදී භාෂාංග පිළිබඳ නිවැරදි අවබෝධයෙන් භාෂාව හසුරුවමින් විවිධ ලේඛන කටයුතුවල යෙදෙයි

**නිපුණතා මට්ටම** :
7.1 අක්ෂර මාලාව පිළිබඳ නිවැරදි අවබෝධය ප්‍රදර්ශනය කරයි
7.2 අක්ෂර වින්‍යාස රීති පිළිබඳ මනා අවබෝධයක් සහිත ව නිවැරදි ව බස හසුරුවයි
7.3 අකාරාදි පිළිවෙළ පිළිබඳ දැනුම ප්‍රායෝගික අවස්ථාවන් සඳහා යොදා ගනියි
7.4 සන්ධි විධි පිළිබඳ ව අවබෝධයෙන් ප්‍රායෝගික සන්ධි රීති පැහැදිලි කරයි
7.5 තර්කානුකූල ව හා විචාරශීලී ව කරුණු සංවිධානය කර ගනිමින් නිර්මාණාත්මක වාක්‍ය රචනා කරයි

7.6 විවිධ ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගනියි
7.7 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි
7.8 ලේඛනයේ දී පද සාධනය හා පද භාවිතය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි
7.9 සම්මත රීති අනුගමනය කරමින් නිවැරදි වාක්‍ය නිර්මාණය කරයි

**කාලච්ඡේද** : 60 යි.

**ඉගෙනුම් ඵල**
- සිංහල අක්ෂර මාලාව වර්ගීකරණය කරමින් ලියා දක්වයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- අකාරාදිය පිළිබඳ දැනුම ඉවහල් කර ගනිමින් ලේඛන ක්‍රමවත් ව සකස් කරයි.
- සන්ධි පිළිබඳ නිවැරදි දැනුම ලේඛනයේ දී ප්‍රදර්ශනය කරයි.
- තර්කානුකූල ව මෙන් ම විචාරශීලී ව කරුණු සංවිධානය කරමින් නිර්මාණාත්මක හා විචාරාත්මක ලේඛන කාර්යයේ යෙදෙයි.
- විවිධ ගද්‍ය පාඨ කියවා එහි අන්තර්ගතය ඉදිරිපත් කරයි.
- විවිධ ලිපිලේඛන සාරාංශකොට ඉදිරිපත් කරයි.
- පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**වාක්‍ය රචනය**

ලේඛකයාගේ අදහස් පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීමත් එම අදහස් පාඨකයාහට මනා ලෙස අවබෝධවන පරිදි ඉදිරිපත් කිරීමත් යන මේ පරමාර්ථ තුන රචනයෙන් ඉටු විය යුතු ය.

රචනයෙහි ප්‍රධාන අංග දෙකකි.

අන්තර්ගත කරුණු

ආකෘතිය

අන්තර්ගතය

අවස්ථා තුනකි.

ආරම්භය

මධ්‍යය (ස්කන්ධය)

අවසානය

ආරම්භය : තෝරාගත් මාතෘකාව පිළිබඳ හැඳින්වීම, මෙය ඉතා කෙටි හැඳින්වීමක් විය යුතුය.

මධ්‍යය : අදාළ කරුණු පිළිවෙලින් සාකච්ඡා කිරීම ඡේද බෙදීම, තර්කානුකූල බව, විශ්ලේෂණාත්මක බව, ප්‍රමාණාත්මක බව, නිරවුල් චින්තනය, කරුණුවල ව්‍යක්තභාවය රචනය තුළ විද්‍යමාන විය යුතු ය.

අවසානය : මුලින් ඉදිරිපත් කළ කරුණු සම්පිණ්ඩනය කරමින් හෝ ඒ පිළිබඳ නිගමන ඉදිරිපත් කරමින් ප්‍රබල අවසානයක් ලබා දිය යුතු ය.

ආකෘතිය : ශිල්පීය දක්ෂතා, පද බෙදීම, විරාම ලක්ෂණ.

ශිල්පීය දක්ෂතා :

- ලේඛනයේ අක්ෂර පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- ලේඛනයේ දී ගැටලු ඇති කරන අක්ෂර පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
- වර්ගාන්ත අක්ෂර හඳුනා ගැනීම හා භාවිතය.
- මහප්‍රාණ අක්ෂර පිළිබඳ අවබෝධය.
- 'ශ', 'ෂ', 'ස' කාරය පිළිබඳ අවබෝධය.
- පිළි භාවිතය නිවැරදි ව හඳුනා ගැනීම.

පද බෙදීම

සිංහලයෙහි නාම, ක්‍රියා, නිපාත සහ උපසර්ග යන පද වර්ග හඳුනාගෙන භාවිත කිරීම.

- නාම පද හා ක්‍රියා පද ලිවීම ගැන මත භේදයක් නොමැත.
- එහෙත් නිපාත උපසර්ග පද භාවිතය මත භේද සහිත ය. එහෙයින් පොත පත ඇසුරෙන් නිවැරදි ව හඳුනා ගැනීමට යොමු කරන්න.

විරාම ලක්ෂණ

විරාම යනු නැවතීමයි. සමාප්තියයි. කෝලනය, තිත් කෝලනය, කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ, හර්ෂාදි ලකුණ, උද්ධෘත පාඨ ලකුණ, වරහන්, කෙටි ඉර, දිග් ඉර ආදි විරාම ලකුණු පිළිබඳ සැලකිලිමත් වීම හා ඒවා නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ ව අවබෝධය ලබා ගත යුතුය.

**අවබෝධය හා සාරාංශකරණය**

අවබෝධය

යම්කිසි ගද්‍ය ඛණ්ඩයක් හෝ පද්‍ය පන්තියක් කෙතරම් දුරට පාඨකයාට අවබෝධ වනුයේදැයි පිරික්සීම මෙහි අරමුණයි.

අවබෝධය පිරික්සීම සඳහා පහත දැක්වෙන ආකාරයේ විවිධ ක්‍රම අනුගමනය කළ හැකිය.

- වචනයක හෝ වාක්‍යාංශයක හෝ නියම අර්ථය විමසීම.
- පද සම්බන්ධයට අනුකූල වන විශේෂ අර්ථයක් වේ නම් එය විමසීම.
- පාඨයෙහි මුඛ්‍ය අදහස සෙවීම.
- පාඨය ආශ්‍රිත ව අසනු ලබන ප්‍රශ්නයකට පිළිතුරු සැපයීම.
- තර්කානුකූලව යම් නිගමනයකට බැසීම.
- කර්තෘගේ අදහස හෝ දර්ශනය සෙවීම.
- කර්තෘයේ තර්කය සෙවීම.
- නියමිත කොටසෙහි අරුත ලිහිල් බසින් ලිවීම.
- පර්යාය ශබ්ද හෝ විරුද්ධාර්ථවත් ශබ්ද සෙවීම.
- අන්තර්ගත කරුණක් සම්බන්ධයෙන් පාඨකයාගේ මතය විමසීම.

**පිළිපැදිය යුතු කරුණු**

- ඡේදයෙහි මුඛ්‍ය අදහස දැන ගැනීම සඳහා ඡේදය එක් වරක් හෝ දෙවරක් කියවීම.
- ඡේදයෙහි ගැබ්වූ අනෙක් අදහස් අනුව එය කොටස්වලට වෙන් කර ගැනීම.
- අන්තර් වාක්‍ය, වාක්‍යාංශ, දුරවබෝධ වචන ආදිය පැහැදිලි කර ගැනීම.
- ඡේදයෙහි අර්ථය සමස්තයක් වශයෙන් මතකයේ තබා ගැනීම.
- අනතුරුව එක් එක් කොටසෙහි අර්ථය සිතෙහි තබා ගැනීම.
- ප්‍රශ්නයෙන් අසනුයේ කුමක් දැයි නිසි ලෙස තේරුම් ගැනීම.
- යම්කිසි කරුණක් විස්තර කළ යුතු නම් එය ඔබේ වචනවලින් විස්තර කිරීම.
- යම්කිසි කරුණක් පැහැදිලි කළ යුතුනම් එය පැහැදිලි කිරීම.
- යමක් පිළිබඳව ඔබේ මතය අසා තිබේ නම්, එය නිර්භයව ප්‍රකාශ කිරීම.
- යමක් තර්කානුකූල ව ප්‍රකාශ යුතු නම් පළමුවෙන් ඒ පිළිබඳ ව කර්තෘගේ තර්කය පහදාදීම.
- ඔබ සපයන පිළිතුරු හැකි තරම් කෙටි විය යුතු ය. අනවශ්‍ය කිසිත් එහි නොතිබිය යුතු ය.

**සාරාංශකරණය**

වාක්‍යයක හෝ අනුඡේදයක හෝ ඡේදයක හෝ පරිච්ඡේදයක හෝ ප්‍රබන්ධයක හෝ දේශනයක හෝ සාරය හෙවත් හරය පමණක් ගෙන හැර දැක්වීම හෙවත් පිඩු කර දැක්වීම සාරාංශකරණය නම් වේ.

උපදෙස්

- සිහිබුද්ධියෙන් සහ අවධානයෙන් යුක්තව ඡේදය වරක් සෝදිසියෙන් කියවන්න. මෙම කියවීමේ දී ඡේදයෙහි මුඛ්‍ය අදහස කුමක් දැයි අවබෝධ කර ගත යුතු ය.
- දෙවනවර කියවීමේ දී මුඛ්‍ය අදහසට අදාළ වන වචන, වාක්‍ය සහ වාක්‍යාංශාදියට යටින් ඉරි ගසා ඒවා ලකුණු කර ගන්න.
- තුන්වන කියවීමේ දී මුඛ්‍ය අදහසට අදාළවන අනෙක් අදහස් ඇත්නම් ඒ සියල්ල ලකුණු කර ගන්න.
- ලකුණු කරගත් වාක්‍ය ඛණ්ඩ පමණක් කියවන්න. පුනරුක්ති නිදර්ශනාදිය ඇත්නම් ඒ අනවශ්‍ය සියල්ල ඉවත් කරන්න.
- උපමා, අලංකාර, අතිශයෝක්ති, උදාහරණ, විස්තර හා අනවශ්‍ය විශේෂණ ආදි සියල්ල අත්හළ යුතු ය.
- වාක්‍ය එකිනෙක අතර ස්වාභාවික සම්බන්ධයක් ඇතිවන අයුරින් ඔබගේ අභිමතය පරිදි අදහස් ගළපා සාරාංශ ලියන්න.
- මුල් ඡේදයෙහි අදහස සාරාංශය කියවන්නාට නිසැකයෙන්ම ප්‍රකට විය යුතුය.
- ඔබ විසින් සම්පිණ්ඩනය කළ යුත්තේ වචන නොව වාක්‍යාංශ සහ වාක්‍ය ඛණ්ඩ පමණක් බව සැලකිල්ලට ගන්න.
- ප්‍රථම පුරුෂය හා අතීත කාලය යෙදිය හැකි සෑම තැනකම යොදන්න.
- වාක්‍ය නිර්මාණය පිළිබඳ විවිධත්වයක් තිබිය යුතුය.
- සාමාන්‍යයෙන් සාරංශයක් මුල් ඡේදයෙන් තුනෙන් එකක් පමණ විය යුතු ය.
- මුල් ඡේදයෙහි ඇති උපුටා ගැනීම්, දෙබස්, සංවාද ආදියෙහි අදහස පමණක් ගෙන සංක්ෂිප්තව ලිඛිත බසින් ලියන්න.
- වනාහි, වූ කලි, නම් ආදි අනවශ්‍ය නිපාත ඉවත් කරන්න.

පද සාධනය

**පද වර්ගීකරණය**

භාෂාවේ අර්ථවත් ඒකක පද ලෙස සැලකිය හැක. එවැනි පද වර්ග මූලික වශයෙන් තුනකි.

නාම පද　　　ක්‍රියා පද　　　අව්‍යය පද

**නාම පද**

නාම පදයක් නිර්මාණය වන්නේ නාමයකට නැත්නම් ශබ්ද ප්‍රකෘතියකට විභක්ති ප්‍රත්‍ය එක්වීමෙනි.

නාම ප්‍රභේද

නාම නාම

ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා

සර්ව නාම

පොදුවේ ව්‍යවහාර කළ හැකි නාම

සමාස නාම

පස් වැදෑරුම් වේ. සමාසවලින් කෙරෙන්නේ පද කෙටි කිරීමකි.

සමාස වූ පදය එක පදයකින් ලියා දැක්වීම ඉතා වැදගත් ය.

ප්‍රත්‍යාර්ථ නාම

තද්ධිත නාම

නාම (ශබ්ද) ප්‍රකෘතියකට තද්ධිත ප්‍රත්‍ය එකතු වීමෙන් සෑදෙන්නේ තද්ධිත නාමයි.

ග + ඉ - ගැමි

කෘදන්ත නාම

ක්‍රියා (ධාතු) ප්‍රකෘතියකට කෘදන්ත ප්‍රත්‍ය එකතුවීමෙන් සෑදෙන්නේ කෘදන්ත නාමයි.

කර + න - කරන

**නාම වර නැඟීම**

ලිංග, සංඛ්‍යා, නියත, අනියත වශයෙන්

| | ඒක වචන | බහු වචන | නියත | අනියත |
|---|---|---|---|---|
| පුරුෂ ලිංග<br>ස්ත්‍රී ලිංග<br>නපුංසක ලිංග | මිනිසා<br>කාන්තාව<br>ගස | මිනිස්සු<br>කාන්තාවෝ<br>ගස් | මිනිසා<br>කාන්තාව<br>ගස | මිනිසෙක්<br>කාන්තාවක්<br>ගසක් |

**ක්‍රියා ප්‍රභේද**

අනවසාන ක්‍රියා

කරයි, බලයි

ආශිර්වාද ක්‍රියා

සැරදේවා !, සැපවේවා !, සෙත් වේවා !

විධි ක්‍රියා

කරන්න, බලන්න, කරව, බලව

ප්‍රයෝජ්‍ය ක්‍රියා

කරවයි, බලවයි

අනවසාන ක්‍රියා

පූර්ව ක්‍රියා

කර, බලා

අපර ක්‍රියා

කරනුව, කරනු (පිණිස), බලනුව, බලනු (පිණිස)

මිශ්‍ර ක්‍රියා

කර කර, බල බලා

කරමින්, බලමින්

අසම්භාව්‍ය ක්‍රියා

කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

කරද්දී, බලද්දී

අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

කළොත්, බැලුවොත්

භාව ක්‍රියා

කිරීම, බැලීම

ශුද්ධ ක්‍රියා/ ශුද්ධ ආඛ්‍යාත

කරයි, බලයි

නාම ආඛ්‍යාත

ඔහු ළමයෙකි.

මම ළමයෙක්මි.

කාල භේදය

| | |
|---|---|
| අතීත | අනතීත |
| කළේය | කරයි |

සංඛ්‍යා භේදය

| | |
|---|---|
| එක් වචන | බහු වචන |
| මිනිසා | මිනිස්සු |

පුරුෂ භේදය

| | | |
|---|---|---|
| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
| මම, අපි | තෝ, නුඹ, තොපි | ඔහු, ඈ |

**විශේෂණ පද**

නාම විශේෂණ

හොඳ, ලස්සන, ගුණවත්, බුද්ධිමත්

ක්‍රියා විශේෂණ

වේගයෙන්, හෙමින්, නිහඬව

**වාක්‍ය සාධනය හා එහි ප්‍රභේද**

සරල වාක්‍ය

සංහත වාක්‍ය

සංකීර්ණ වාක්‍ය

**සරල වාක්‍ය**

කර්තෘ, කර්ම, ක්‍රියා සහිත තනි වාක්‍ය

උදාඃ ඔහු පුවත් පත කියවයි.

**සංහත වාක්‍ය**

වාක්‍ය දෙකක් එකට සම්බන්ධවීමේ දී ඒ දෙකම ප්‍රධාන අප්‍රධාන වශයෙන් සැලකිය නොහැකි වාක්‍ය.

උදා ඃ හිරු උදාවෙයි, බැස යයි.

**සංකීර්ණ වාක්‍ය**

ප්‍රධාන වාක්‍යයකට උප වාක්‍යයක් හෝ කිහිපයක් ඇතුළත් වාක්‍ය

උදා ඃ කුකුළන් හඬලද්දී මම නිවසින් පිටත් වීමි.

**ප්‍රශ්නාර්ථ වාක්‍ය**

මැතිවරණය පැවැත්වෙන්නේ කවදා ද?

**ප්‍රශ්නාර්ථ වාචී පද**

උදා ඃ කවුද, කුමක් ද, කෙසේ ද

ඇයි, මොනවා, කවුරු

කොහොම, කොයිබ ආදි වශයෙනි.

**නිෂේධාර්ථ වාක්‍ය**

උදා ඃ නැත, නොවේ, නොමැත

මල්ලි ඊයේ රෑ බත් කා නැත

ඔහු දිනපතා කාර්යාලයට පැමිණෙන්නේ නොවේ

නැත යන පදය දෙවරක් යෙදුණු විට ප්‍රතිෂේධනය ඉවත් වේ.

ඇත, නැත යෙදුම් සහිත වාක්‍යවල විශේෂතා

ඇත/ නැත යෙදුමකට මුලින් භාව ක්‍රියාවක් හෝ පූර්ව ක්‍රියාවක් යෙදී ඇති විට කර්තෘ අනුක්ත වේ.

උදා ඃ ළමයෙකු ගීයක් ගයනු ඇත.

මා ඒ පොත කියවා නැත.

**උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය**

උක්ත අනුක්ත භේදය

කර්තෘ උක්ත වීම (කර්තෘ කාරකය)

කර්මය උක්ත වීම (කර්ම කාරකය)

**ඡේක ප්‍රයෝග හා වාක්‍ය රීති**

අප්‍රාණවාචී පද යෙදීම.

උදා ඃ ගංගා ගලයි.

ගංගාවෝ ගලති.

'යි' නිපාතයෙන් සමත්වෙති'යි ගුරුවරු සිතති.

**ගෞරවාර්ථයේ පද යෙදීම.**

ආණ, අණු, අණි, වහන්සේ, සේක, දෑ ආදි යෙදුම් භාවිතය

උදා ඃ පියාණෝ පැමිණෙති.

ස්වාමින් වහන්සේ වඩිති.

**සමූහාර්ථවාචී පද උක්ත වීම**

රැළ, රෑස, රංචුව, කැල, පෙළ, සෙනග

උදා ඃ තරුණ පෙළ යහමග යති.

**ද්විත්ව උක්තය යෙදීම**

උදා ඃ බොහෝ ගුරුවරු ලේඛකයෝ වෙති.

**සමුච්චයාර්ථයේ නිපාත යෙදීම.**

හා, සහ, ද, හා, ත් භාවිතය

උදා ඃ අම්මාත් මමත් පන්සල් ගියෙමු.

**අසම්භාව්‍ය ක්‍රියා ආශ්‍රිත වාක්‍ය**

කලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

උදා ඃ සීනුව නාද වෙද්දී ගුරුතුමා පන්තියට පැමිණියේ ය.

අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

උදා ඃ හොඳින් පාඩම් කළහොත් විභාගයෙන් සමත් වේවි.

**ආශිර්වාද ක්‍රියා ආශ්‍රිත වාක්‍ය**

උදා ඃ සියලු සතවයෝ නිදුක් වෙත්වා!

**නාම ධාතුක ක්‍රියාව ආශ්‍රිත වාක්‍ය**

මම ගුරුවරයෙක්මි.

හේ ලේඛකයෙකි.

**උපමාවාචී නිපාත ආශ්‍රිත වාක්‍ය**

මෙන්, සේ, එව්, වැනි, වගේ, බඳු

උදා ඃ දෙවි දේවතාවුන් වැනි මිනිස්සු ඇත.

**අවිනිශ්චිතාර්ථයේ 'වි' නිපාතය යෙදීම**

උදා ඃ අප විභාගයෙන් සමත් වේවි.

**යුතුය යන යෙදුම සහිත වාක්‍ය**

උදා ඃ පාරේ යන්නන් දකුණෙන් යායුතු ය.

පාරේ යන්නෝ දකුණෙන් යායුත්තාහ.

**විකල්පාර්ථයේ හෝ නිපාතය**

උදා ඃ අම්මා හෝ මම හෝ කොළඹ යමි.

**හෙවත්, නොහොත් යෙදීම**

උදා ඃ සිරිපාල හෙවත් මරු සිරා එල්ලුම් ගහට නියම විය.

විදුහල්පති නොහොත් නියෝජ්‍ය විදුහල්පති පොත් බෙදා දෙයි.

**කථන ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය**

ලේඛනයේ දී ක්‍රියා පදය, කාල, පුරුෂ, වචන භේදය අනුව සම්මත රීතියක් යටතේ අනුව යෙදේ.

උදා ඃ මම යමි

කථනයේ දී එසේ නොයෙදේ. බහුලව කෘදන්ත රූප යෙදේ.

උදා ඃ මං යනවා (භාව කෘදන්තය)

මා යනවා

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියාකරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයිමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්විම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතුවෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනිමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරිම සඳහා යෙදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනිමට යොදා ගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයිමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේදැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරිමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත්විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනිමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දිම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනිම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරිම මේ අනුව ගුරුවරුන්ගේ බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියාකරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන් ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්‍ෂම කිරීම පිණිස වඩා හොද කාර්යක්‍ෂමතාවයෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාරතමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්‍ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | පැවරුම් | 02 | ව්‍යාපෘති |
| 03. | සමීක්‍ෂණ | 04 | ගවේෂණ |
| 05 | නිරීක්‍ෂණ | 06 | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 07 | ක්‍ෂේත්‍ර චාරිකා | 08 | කෙටි ලිඛිත පරීක්‍ෂණ |
| 09 | ව්‍යුහගත රචනා | 10 | විවෘත ග්‍රන්ථ පරීක්‍ෂණ |
| 11 | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12 | ශ්‍රවණ පරීක්‍ෂණ |
| 13 | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14 | කථනය |
| 15 | ස්ව නිර්මාණ | 16 | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17 | සංකල්ප සිතියම | 18 | ද්විත්ව සටහන් ජර්නල |
| 19 | බිත්ති පුවත්පත් | 20 | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21 | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22 | විවාද |
| 23 | සාකච්ඡා මණ්ඩල | 24 | සම්මන්ත්‍රණ |
| 25 | ක්ෂණික කථා | 26 | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම සෑම එකක්ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්‍ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනිමට ගුරුවරුන් දැනුවත් විය යුතුය; වග බලා ගත යුතුය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන්ම ආවේදනික ගති ලක්‍ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළගා කර ගැනිමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

| | |
|---|---|
| වාරය | 01 |
| ඇගයීම් සැලසුම් අංකය | 01 |
| නිපුණතාව | 0.1 |
| නිපුණතා මට්ටම | 1.2, |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | සංකල්ප සිතියමක් |
| ක්‍රියාවලිය | සිංහල නවකතා ඉතිහාසය දැක්වෙන සංකල්ප සිතියමක් නිර්මාණය කිරිම. |

| නිර්ණායක / සිසුන්ගේ නම් | තොරතුරුවල නිවැරදි බව | පැහැදිලි බව | නිර්මාණාත්මක බව | ප්‍රමාණය ලෙස කරුණු දැක්වීම | සමස්ත නිමාව | ලැබූ ලකුණුවල එකතුව | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 01 |
| ඇගයීම් සැලසුම් අංකය | 02 |
| නිපුණතාව | 0.1 |
| නිපුණතා මට්ටම | 4.1, 4.2 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | ප්‍රශ්න හා පිළිතුරු පොත් |
| ක්‍රියාවලිය | සන්දේශ සාහිත්‍යයේ විකාශය හා සන්දේශ කාව්‍යයක මූලික ලක්ෂණ පැහැදිලි වන සේ ප්‍රශ්න සහ පිළිතුරු සැකසීම. |

| නිර්ණායක / සිසුන්ගේ නම් | තේමාව අදාළ බව | ප්‍රශ්නවල ප්‍රමාණාත්මක | පිළිතුරුවල නිවැරදි බව | ප්‍රශ්නවල ගුණාත්මක බව | පොතේ නිමාව | ලැබූ ලකුණුවල එනතුව | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 01 |
| ඇගයීම් සැලසුම් අංකය | 03 |
| නිපුණතාව | 5.0 |
| නිපුණතා මට්ටම | 5.1 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | කථනය |

ක්‍රියාවලිය

- කෙටිකතාවේ ස්වභාවය
- කෙටිකතාවේ මූලික ලක්ෂණ
- කෙටිකතා සම්ප්‍රදායන් යන මාතෘකා ඔස්සේ කථික තරගයක් පැවැත්වීම.

| නිර්ණායක / සිසුන්ගේ නම් | ප්‍රවේශය හා හැඳින්වීම | මාතෘකාවට අදාළ බව | හඬ පාලනය හා උච්චාරණය | අංග චලනය | කාල කළමනාකරණය | ලැබූ ලකුණුවල එකතුව | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 02 |
| ඇගයීම් සැලසුම් අංකය | 01 |
| නිපුණතාව | 2.0 |
| නිපුණතා මට්ටම | 2.3, 2.4 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් |
| ක්‍රියාවලිය | 2.3 හා 2.4 නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සංවිධානය කිරීම (සිසුන් මගින් ප්‍රශ්න හා පිළිතුරු සකස් කර කණ්ඩායම් මගින් තරගය පවත්වන්න.) |

| නිර්ණායක / සිසුන්ගේ නම් | ඉදිරිපත්වීම | ප්‍රශ්න හා පිළිතුරුවල නිවැරදි බව | ප්‍රශ්න ඉදිරිපත් කිරීම | දෙනු ලබන කාලය තුළ පිළිතුරු සැපයීම | නිවැරදි පිළිතුරු ප්‍රකාශ කිරීම | ලැබූ ලකුණුවල එකතුව | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 02 |
| ඇගයීම් සැලසුම් අංකය | 02 |
| නිපුණතාව | 2.0 |
| නිපුණතා මට්ටම | 2.4 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | ද්විත්ව සටහන් ජර්නලය |

ක්‍රියාවලිය

නාට්‍ය ප්‍රධාන චරිත හඳුනාගෙන ඒවායේ චරිත ලක්ෂණ ද්විත්ව සටහන් ජර්නලයක සටහන් කිරීම. මෙය කේවල ක්‍රියාකාරකමකි. (ද්විත්ව සටහන් ජර්නලයෙහි වම් පැත්තේ චරිතයක් දකුණු පසෙහි එන චරිතයට අදාළ චරිත ලක්ෂණ නාට්‍යයෙන් ඉස්මතුවන අවස්ථාද එහි සටහන් කරන්න.)

| නිර්ණායක / සිසුන්ගේ නම් | නිවැරදි ද්විත්ව සටහන් ද්විත්ව ජර්නලය භාවිත කිරිම | ප්‍රධාන චරිත හඳුනා ගැනීම | චරිත ලක්ෂණ සටහන් නිවැරදිව සටහන් කිරීම | චරිත ලක්ෂණවලට නිදසුන් සැපයීම | ද්විත්ව සටහන් ජර්නලය නිවැරදි ව පවත්වාගෙන යාම | මුළු ලකුණු | අවසාන ලකුණ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 02 |
| ඇගයීම් සැලසුම් අංකය | 03 |
| නිපුණතාව | 6.0 |
| නිපුණතා මට්ටම | 6.2, 6.3 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | ප්‍රදර්ශනයක් |

ක්‍රියාවලිය

නූතන යුගයේ කාව්‍යයෙහි විවිධතා හා සිංහල කවියේ නව ප්‍රවණතා ගවේෂණය කර ප්‍රදර්ශනයක් පැවැත්වීම.

| නිර්ණායක / සිසුන්ගේ නම් | මාතෘකාවට අදාළ බව | තොරතුරුවල නිරවද්‍යතාව | ක්‍රමානුකූල බව | ආකෘතිය | නිමාව | මුළු ලකුණු | අවසාන ලකුණු මුළු ලකුණ |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

වාරය 03

ඇගයීම් සැලසුම් අංකය 01

නිපුණතාව 1.0

නිපුණතා මට්ටම 1.3

ඇගයීම් සැලසුම් ස්වාභාවය ව්‍යුහගත රචනා

ක්‍රියාවලිය

මළගිය ඇත්තෝ නව කතාවේ භාෂාව හා කතා වින්‍යාසය පිළිබඳ ගවේෂණයක් කොට විචාරශීලී ව හා තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරමින් රචනාවක් ලිවීම.

| නිර්ණායක / සිසුන්ගේ නම් | මාතෘකාවට අදාළ බව | පැහැදිලි අක්ෂර | කරුණු සනාථ කිරීම | කරුණු තර්කානුකූල වීම | අවසානය | මුළු ලකුණු | අවසාන ලකුණු මුළු ලකුණ |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 03 |
| ඇගයීම් සැලසුම් අංකය | 02 |
| නිපුණතාව | 3.0 |
| නිපුණතා මට්ටම | 3.3, 3.4 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | බිත්ති පුවත්පතක් |

ක්‍රියාවලිය

සද්ධර්ම රත්නාවලියේ සහ පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය පිළිබඳ විග්‍රහයක් කරමින් බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම.

| නිර්ණායක / සිසුන්ගේ නම් | තේමාවට අදාළ බව | කරුණුවල නිවැරදි බව | කරුණු සනාථ කිරීම | නිවැරදි අක්ෂර වින්‍යාසය | නිමාව | මුළු ලකුණු | අවසාන ලකුණු මුළු ලකුණ |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |

| | |
|---|---|
| වාරය | 03 |
| ඇගයීම් සැලසුම් අංකය | 03 |
| නිපුණතාව | 4.0 |
| නිපුණතා මට්ටම | 4.3 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | කණ්ඩායම් ක්‍රියාකාරකම් |

ක්‍රියාවලිය

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ගිරා සන්දේශයේ තෝරාගත් වර්ණනාවක් පිළිබඳ රසාස්වාදයක් කර ඉදිරිපත් කිරීමට සැලැස්වීම.

| නිර්ණායක / සිසුන්ගේ නම් | අරමුණ පැහැදිලි කිරීම | රචනා ශෛලිය | ඖචිත්‍ය පද භාවිතය | කරුණු සනාථ කිරීම | සමස්තය | මුළු ලකුණු | අවසාන ලකුණු මුළු ලකුණ |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

| | ලකුණු |
|---|---|
| නිපුණතා මට්ටමට පැමිණ ඇත | 4 |
| | 3 |
| නිපුණතා මට්ටමට පැමිණ නැත | 2 |
| | 1 |